# බස්නාහිර පළාතේ පළාත් සභාව
## மேல் மாகாண மாகாண சபை
## WESTERN PROVINCE PROVINCIAL COUNCIL

**2013 මැයි 21 වන අඟහරුවාදා**
2013 மே 21 செவ்வாய்க்கிழமை
Tuesday 21st May 2013

**බත්තරමුල්ල, ශ්‍රී ජයවර්ධනපුර, ඩෙන්සිල් කොබ්බෑකඩුව මාවතේ, අංක 204 හි පිහිටි බස්නාහිර පළාත් සභා නව ගොඩනැගිලි සංකීර්ණයේ නව සභා ශාලාවේදී පැවති සභා රැස්වීම**

பத்தரமுல்ல, ஸ்ரீ ஜயவர்த்தனபுர, டென்சில் கொப்பேகடுவ மாவத்தை, இல.204 இல் மேல் மாகாண சபையின் புதிய கட்டடத் தொகுதியில் அமைந்துள்ள புதிய சபை மண்டபத்தில் நடைபெற்ற கூட்டம்.

The meeting held at the Western Provincial Council new building complex at No.204, Denzil Kobbekaduwa Mawatha, Sri Jayawardhanapura, Battaramulla.

**පූ.භා. 09.55 පළාත් සභාව රැස් විය.**
*மு.ப.09.55 க்கு சபை கூடியது*
*The Provincial Council met at 09.55 a.m.*

**ගරු සභාපතිතුමා [ සුනිල් විජේරත්න මහතා ] මූලාසනාරූඪ විය.**
*திரு. தவிசாளர்[ சுனில் விஜேரத்ன அவர்கள் ] தலைமை வகித்தார்.*
*Mr. Chairman [ Sunil Wijerathne ] in the Chair*

# සභාපතිවරයාගේ නිවේදන
## ANNOUNCEMENTS OF CHAIRMAN

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

*i*

*"ආණ්ඩු පක්ෂයේ ගරු ප්‍රධාන සංවිධායක රේණුක පෙරේරා මැතිතුමාව සහ ගරු පළාත් සභා මන්ත්‍රී එම්. මුජිබුර් රහුමාන් මැතිතුමාව මහජන පෙත්සම් කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් 2013.05.21 දින සිට ක්‍රියාත්මක වන පරිදි මා විසින් නම් කරනු ලැබ ඇති බව දැනුම් දෙනවා."*

*ii*

*"කාර්ය පටිපාටි රීති 84(3) ට අනුව, පහත නම් සඳහන් ගරු මන්ත්‍රීවරුන්ගේ අමාත්‍යාංශ උපදේශක කාරක සභා සාමාජිකත්වය අහෝසි වී ඇති බව දැනුම් දෙනවා."*

*ප්‍රධාන අමාත්‍ය සහ මුදල් හා ක්‍රම සම්පාදන, නීතිය හා සාමය, ඉඩම්, අධ්‍යාපන, පළාත් පාලන හා පළාත් පරිපාලන, මිනිස්බල හා රැකී රක්ෂා, ආර්ථික ප්‍රවර්ධන සහ විදුලිබල හා බලශක්ති සහ වෙළඳ අමාත්‍යාංශය :*

*එම්. නවුසර් ෆවුසි ගරු මන්ත්‍රීතුමා*
*ශිරාල් ලක්තිලක ගරු මන්ත්‍රීතුමා*

*සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු පිළිබඳ අමාත්‍යාංශය :*

*රෝස් ප්‍රනාන්දු ගරු මන්ත්‍රීතුමිය*
*නිමල් ආර්. පීරිස් ගරු මන්ත්‍රීතුමා*
*සන්ධ්‍යා සිරිවර්ධන ගරු මන්ත්‍රීතුමිය*
*චන්දන ජයකොඩි ගරු මන්ත්‍රීතුමා*
*ඉසුර දේවප්‍රිය ගරු මන්ත්‍රීතුමා*

*ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමූපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශය :*

*තුෂාර පෙරේරා ගරු මන්ත්‍රීතුමා*
*කාමල් කුරුප්පු ගරු මන්ත්‍රීතුමා*
*රන්ජිත් රොද්‍රිගු ගරු මන්ත්‍රීතුමා*
*යූ.එල්. සේනක දමයන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා*
*හෂාන් තිලකරත්න ගරු මන්ත්‍රීතුමා*
*අජ්මාල් මවුජුඩ් ගරු මන්ත්‍රීතුමා*
*විජිත් ප්‍රියන්ත ද සිල්වා ගරු මන්ත්‍රීතුමා*

*කෘෂිකර්ම, ගොවිජන සංවර්ධන, සුළු වාරිමාර්ග, කර්මාන්ත සහ පරිසර කටයුතු අමාත්‍යාංශය :*

*රවී විජේසේකර ගරු මන්ත්‍රීතුමා*
*ලක්ෂ්මන් විජේමාන්න ගරු මන්ත්‍රීතුමා*

*අදාළ පත් කිරීම් ඉදිරි කාලයේදී සිදු කරනවා.*

*මහා මාර්ග අමාත්‍යාංශයේ වාර්තාව අපට තවමත් ලැබී නැහැ. මම ගරු අමාත්‍යතුමාගෙන් ඉල්ලීමක් කරනවා, රීති අංක 84(3) ට අදාළ නිවේදනය කළ යුතු නාම ලේඛනය කරුණාකර ඔබතුමා හැකි ඉක්මණින් අප වෙත ලබා දෙන්න කියලා.*

*iii*

*"ප්‍රධාන අමාත්‍යාංශය සහ අධ්‍යාපන, ඉඩම් හා පළාත් පාලන අමාත්‍යාංශයීය උපදේශක කාරක සභාවේ සාමාජිකයන් වශයෙන් ගරු පළාත් සභා මන්ත්‍රී වරුණ දීප්ති රාජපක්ෂ මැතිතුමාව සහ ගරු පළාත් සභා මන්ත්‍රී සී.වයි.පී. රාම් මැතිතුමාව 2013.05.21*

*දින සිට ක්‍රියාත්මක වන පරිදි මවිසින් නම් කරනු ලැබූ බව දැනුම් දෙනවා."*

# ලිපිලේඛනාදිය පිළිගැන්වීම
## PAPERS PRESENTED

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා) [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs) [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, *"පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම - 2012 වර්ෂය" නමැති ලේඛනය මම මෙම ගරු සභාවට පිළිගන්වනවා.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒ පිළිබඳ වැඩිදුර සාකච්ඡාව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයට එළඹුනු විටදී කිරීමට බලාපොරොත්තු වෙනවා.

# කාරක සභා වාර්තා
## COMMITTEE REPORTS

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

පහත සඳහන් කාරක සභා වාර්තා මම පිළිගන්වනවා.

i. 2013.05.08 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීම් වාර්තාව.

ii 2013.04.02 දින පැවති මහජන පෙත්සම් කාරක සභා වාර්තාව.

***අදාළ වාර්තාවල පිටපත් ගරු මන්ත්‍රීවරුන්ගේ මේසය මත තබා ඇති බව ගරු සභාපතිතුමා විසින් ප්‍රකාශ කරන ලදී.***
*Hon. Chairman declared that the copies of the relevant reports are placed on the tables of the Hon. Members.*

# පෙත්සම්
## PETITIONS

**ගරු යූ. ජෝර් පෙරේරා -** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ගරු සභාපතිතුමනි, වැලිවේරිය, කිරිකිත්ත, කිතුලකන්දගම, අංක 125 හි පදිංචි එම්.ටී. ෂර්ලි සේනානායක යන අයගේ පෙත්සම මම ඉදිරිපත් කරනවා.

**ගරු යසපාල කෝරළගේ**
Hon . Yasapala Koralage

ගරු සභාපතිතුමනි, පහත සඳහන් පෙත්සම් මම ඉදිරිපත් කරනවා.

i. බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුවේ ඒ.ජී. දුමින්ද ප්‍රසාද්, කළුතර, කලාප අධ්‍යාපන කාර්යාලයේ කේ.එස්.ජී. ලියනගේ සහ කොළඹ කලාප අධ්‍යාපන කාර්යාලයේ කේ.ඩී. අජිත් රවීන්ද්‍ර යන අයගේ පෙත්සම සහ,

ii. වාද්දුව, වසන්තාරාම පාර, 80/3, ලිප්ටන්/ලින්ටන් හවුස්, අංක 80/3 හි පදිංචි එස්.ආර්.ආර්. සිල්වා යන අයගේ පෙත්සම.

**** [ සභා මේසය මත තබන ලද පෙත්සම්]***
*[Tabled petitions]*

සුමිත් ලාල් මෙන්ඩිස් ගරු මන්ත්‍රීතුමාගේ අත්සනින් යුත්,

කළුතර, නාගොඩ, නෑබඩ පාර, කර්මාන්තපුර අසල, අංක 44 හි පදිංචි ධනුෂ්ක පුෂ්පකුමාර යන අයගේ පෙත්සම සහ,

කොළඹ 07, ශ්‍රාවස්ති මන්දිරය, සැලසුම් අංශය, ප්‍රධාන ලේකම් කාර්යාලේ එම්.කේ. වසන්ති ප්‍රදීපිකා යන අයගේ පෙත්සම.

***ඉදිරිපත් කරන ලද පෙත්සම් මහජන පෙත්සම් කාරක සභාවට යොමු කළ යුතු යැයි නියෝග කරන ලදී.***
*Petitions Presented, ordered to refer to the Petitions committee*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. මීට පෙරත් මේ සභාව තුළ මේ ප්‍රශ්නය සම්බන්ධව සාකච්ඡා කරලා තිබුණා. ඒ වාගේම ඔබතුමාගේ මාර්ගයෙන් මාර්ග ඇමතිතුමා පොරොන්දු වුණා මේ භූමිය සකස් කරනවාය කියලා. අද වැහි දවස්. විශේෂයෙන් වාහන ටික ඇතුළට ගන්න බැහැ. පළාත් සභා සංකීර්ණය තුළ මේ රැස්වීම් භූමියේ පාරවල් ඉතාම අබලන් තත්ත්වයේ තිබෙනවා. ඔබතුමාගේ කඩිනම් අවධානය යොමු කරනවා. ඒ මාර්ගය සකස් කරලා දෙන්නය කියලා. කැන්ටිමට යන්නත් බැහැ. පයින් යන්නත් බැහැ. එහා පැත්තේ Toilet එකට යන්නත් අමාරු තත්ත්වයක් තිබෙනවා. විශේෂයෙන්ම මේ මාර්ගය සකස් කරලා දෙන්නය කියන එක ඔබතුමා මාර්ගයෙන් ගරු ඇමතිතුමාගෙන් ඉල්ලීමක් කරනවා.

**ගරු නිමල් ලාන්සා** (මාර්ග සංවර්ධන, සත්ව නිෂ්පාදන හා සංවර්ධන, නිවාස හා ඉදි කිරීම්, ධීවර හා සංචාරක අමාත්‍යතුමා)
Hon. Nimal Lansa - (Minister of Road Development, Animal Production and Development, Housing and Construction, Fisheries and Tourism)

ගරු සභාපතිතුමනි, ගියපාරත් අපේ ප්‍රධාන අමාත්‍යතුමා ඒකට උත්තරයක් දුන්නා. මොකද, අපේ ප්‍රධාන කාර්යාල සංකීර්ණය හදන්න යන්නේ මෙතැන. ඒකේ මූලික කටයුතු සිදු කරනවා.

ගියවරත් අපි සකස් කළා. නමුත් වැස්සට හේදිලා යනවා. අපි නඩත්තු අංශයෙන් පොඩ්ඩක් සකස් කරලා දෙන්නම්. හරි විධියට නොවෙයි.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ මේ වන විට සභාවේ ගණ පූරණය නැහැ. අද දවසේ මිනිස්සුන්ට දරන්න බැරි විදුලි බිලට විරුද්ධත්වය ප්‍රකාශ කරමින් මන්ත්‍රීවරුත් සියලු දෙනාම සභාවේ නැහැයි කියලා පේන්නේ. ඒ නිසා ගණ පූරණය පිළිබඳ ප්‍රශ්නය ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කරුණාකර සීනුව නාද කරන්න.

***සභාවේ ගණපූරණය නොමැති බව පෙනී ගියෙන් කැඳවීම් සීනුව නාද කරවීමට නියෝග කරන ලදී.***

***පසුව ගණපූරණය ඇති නොවූයෙන් ගරු සභාපතිතුමා විසින් රැස්වීම තාවකාලිකව අත් සිටුවන ලදින් පූ.භා. 10.20 ට යළිත් රැස්විය.***

*Committee counted, and a Quorum not being present, the Division bells were ordered to be rung,*

*Later, It found no quorum Hon. Chairman, suspended the sitting and it resumed at 10.20 a.m.*

# ප්‍රශ්නවලට වාචික පිළිතුරු
ORAL ANSWERS TO QUESTIONS

***න්‍යාය පත්‍රයේ අංක 01 සහ 02 යටතේ මංජු ශ්‍රී අරංගල, ගරු විපක්ෂ නායකතුමාගේ නමින් යුත් ප්‍රශ්නය ගරු සමූපකාර අමාත්‍යතුමාට ඉදිරිපත් කරන ලදුව, ඊට සති 03 ක කාලයක් කල් ඉල් බැවින්, ප්‍රශ්නය අදාළ සභාවට යොමු කරන ලෙසට ගරු සභාපතිතුමා විසින් නියෝග කරන ලදී.***

*The question by the name of the Hon. Leader of the Opposition Manju Sri Arangala having presented to the Hon. Minister of Cooperatives under No. 01 and 02 of the Agenda,and, since the Hon. Minister requested 03 weeks for a reply to be given, Hon. Chairman ordered the question to be referred to the relevant Council Meeting.*

# අමාත්‍යාංශ නිවේදන/අමාත්‍යවරුන්ගේ ප්‍රකාශ
MINISTRIES ‘ ANNOUCEMENTS/ MINISTERS ‘ STATEMENTS

**ගරු ජගත් අංගගේ** (සෞඛ්‍ය, දේශීය වෛද්‍ය, සමාජ සුභ සාධන හා කාන්තා කටයුතු, පරිවාස හා ළමා රක්ෂක සේවා සහ සභා කටයුතු අමාත්‍යතුමා)
Hon. Jagath Angage (Minister of Health, Indigenous Medicine, Social Welfare and Women's Affairs , Probation and Child Care Services and Council Affairs)

ගරු සභාපතිතුමනි, අද දවස පිළිබඳව රටේ ආන්දෝලනාත්මක ස්වභාවයක් තිබුණා. ඒ වාගේම අද අපේ ආයතනවල රාජකාරී කටයුතු කිසිවක් ක්‍රියාත්මක නොවන බවට ප්‍රචාරය වී තිබුණා. බස්නාහිර පළාත් සභාවේ ගරු ප්‍රධාන අමාත්‍යතුමා මේ අවස්ථාවේ දිවයිනෙන් බැහැරව සිටියත්, අධ්‍යාපන අමාත්‍යාංශය සහ එතුමාට අදාළ සියලුම ආයතනවල රාජකාරී කටයුතු නියමිත ආකාරයට මේ අවස්ථාව වන විට ක්‍රියාත්මක වන බවත්, ඒ වාගේම සෞඛ්‍ය අමාත්‍යාංශය සහ ඊට අනුබද්ධ සියලුම ආයතන කිසිම බාධාවකින් තොරව ප්‍රජාවගේ අවශ්‍යතාවයන් සැපිරීම සඳහා ක්‍රියාත්මක වන බවත්, ඒ වාගේම ප්‍රවාහන අමාත්‍යාංශයේ මගී ප්‍රවාහන කටයුතු ඒ ආකාරයෙන්ම හොඳින් ක්‍රියාත්මක වන බවත් ගරු ඔබතුමාට මේ සභාවේදී මේ අවස්ථාවේදී දැනුම් දෙනවා. ඒ නිසා සමස්තයක් වශයෙන් සාමාන්‍යයෙන් සුපුරුදු දිනක ආකාරයටම සමස්ත සේවාවන් බස්නාහිර පළාත් සභාවට අයත් සියුලම අමාත්‍යාංශවල, සියලුම දෙපාර්තමේන්තුවල, අධිකාරිවල, සෙසු සියලුම ආයතනවල ක්‍රියාත්මක වන බව ගරු සභාවේ දැන ගැනීම පිණිස මේ අවස්ථාවේදී ප්‍රකාශ කරනවා.

# පෞද්ගලික පැහැදිලි කිරීම්
PERSONAL EXPLANATIONS

**ගරු මහේෂ් අල්මේදා**
Hon. Mahesh Almeda

ගරු සභාපතිතුමනි, ඔබතුමාට ස්තුතිවන්ත වෙනවා මේ අවස්ථාව ලබා දීම පිළිබඳව. ඔබතුමා දන්නවා රාජ්‍ය සේවකයෙක් නොවෙයි, ඕනෑම සේවකයෙක් තමන්ගේ සේවය නිසියාකාරව කරන්න නම් මානසික නිදහස, මානසික තත්ත්වය ඉතාමත් යහපත් අයුරින් තිබිය යුතුව තිබෙනවා. විශේෂයෙන් වෙනත් සේවකයෙක් වාගේ නොවෙයි. විදුහල්පතිවරයෙකුගේ, ගුරුවරයෙකුගේ මානසික තත්ත්වය ඉතාම නිවැරදිව තිබුණේ නැත්නම් ඔවුන්ගේ සේවාව නිවැරදිව කරන්න බැරිව යනවා. ඔවුන් නිර්මාණය කරන්නේ යකඩින් හදන දෙයක්වත්, මැටියෙන් හදන දෙයක්වත් නොවෙයි. මනුස්ස ජීවිත තමයි නිර්මාණය කරන්නේ. ඒ නිසා ඔවුන්ගේ ජීවිත ඉතාම යහපත්ව තිබීම අත්‍යවශ්‍යයි. ඔවුන්ගේ මානසිකත්වය ඉතාමත්ම යහපත්ව තිබුණොත් තමයි, තමන්ට තමන්ගේ අනාගත පරපුර නිර්මාණය කිරීමේ කාර්යභාරය වගකීමෙන් කරන්න පුළුවන්කම ලැබෙන්නේ. මම මේ කථා කරන්නේ ගරු සභාපතිතුමනි, හෝමාගම අධ්‍යාපන කලාපයේ පාසල්වල වැඩ කරන විදුහල්පතිවරු දහඅට දෙනෙකුගේ මේ මාසයේ වැටුප් කපා දැමීමක් සිදු කර තිබීම පිළිබඳවයි. අතිවිශාල වැටුප් ප්‍රමාණයක් කපා දැමීමක් සිද්ධ කරලා තියෙනවා. ගරු සභාපතිතුමනි, 2010 මිලදී ගැනීමක් පිළිබඳ සිද්ධ වුණු පරීක්ෂණයකින් අනතුරුව තමයි මේ කාරණය සිද්ධ වෙන්නේ. මම මේ කියන්නට යන්නේ ගරු සභාපතිතුමනි, මෙහිදී දඩුවම් ලැබිය යුතු අයට නොවෙයි දඩුවම් ලැබෙන්නේ. අහිංසක පිරිසකට තමයි දඩුවම් ලැබෙන්නේ. ඒ නිසා තමයි මේ විදුහල්පතිවරු විශාල මානසික පීඩනයකට ලක් වෙලා තියෙන්නේ. 2010.03.25 වැනිදා අධ්‍යාපන අමාත්‍යාංශයෙන්, ඉසුරුපායෙන් චක්‍රලේඛයක් එවනවා. අංක ED5/90/01(පොදුII) හා 2010.03.25 දිනැති චක්‍රලේඛයෙන් කියනවා, ගුණාත්මක යෙදුම්වලට වෙන් වෙලා තියෙන මුදල්වලින් පාසලට අවශ්‍ය කරන

භාණ්ඩ මිලදී ගන්නය කියලා. මේ භාණ්ඩ මිලදී ගන්න කියලා ලියුම එව්වාට පස්සේ හෝමාගම අධ්‍යාපන කලාපයේ එවකට සේවය කරපු අධ්‍යාපන අධ්‍යක්ෂිකාව චිත්‍රාංගනි ලුණුවිල මැතිනිය

[ ගරු මහේෂ් අල්මේදා ]

2010.03.26 වෙනි දා, ඒ කියන්නේ චක්‍රලේඛය එවපු දවසට පහුවෙනිදා සියලු විදුහල්පතිවරුන්ට ලිපියක් එවනවා, වහාම මේ ගුණාත්මක යෙදුම් සඳහා වූ මිලදී ගැනීම් කරන්නය කියලා. ඒ අනුව 2010.03.26 දා, ඒ කියන්නේ ඊට පහුවෙනිදා අධ්‍යක්ෂතුමිය විදුහල්පතිවරුන්ට ලිපියක් එවනවා. ඊට පහුවෙනිදා විදුහල්පතිවරුන් සියලු දෙනා හෝමාගම මධ්‍ය මහා විද්‍යාලයට කැඳවලා විදුහල්පති රැස්වීමක් තියලා 2010.05.27 වැනිදා, ගෙන්වනවා ආයතනයක්. මේ ආයතනයට කියන්නේ ලංකා කොස්මොක්ස් ටෙක්ස් ප්‍රයිවට් ලිමිටඩ් කියලා. මේ ආයතනය ගෙනැල්ලා මේ අධ්‍යක්ෂතුමිය මේ ආයතනය වෙනුවෙන් promotion campaign එකක් කරනවා, ඒ ආයතනයේ බඩු මිලදී ගන්නය කියලා. ඒ අනුව එක සතියක් ඇතුළත විවිධ විද්‍යුත් භාණ්ඩ පාසල්වලට මිලදී අරගෙන, ඒවාට මුදල් ගෙවලා, ඒවාට චෙක් අත්සන් කරලා, සියල්ල අවසන් කරලා විදුහල්පතිවරුන්ට මේ භාණ්ඩ භාර දෙනවා.

ගරු සභාපතිතුමනි, මේ සියල්ල සිද්ධ කරනු ලබන්නේ, යවන ලිපි සහ වාචිකව කරන බලපෑම් මගින්. ඒ නිසා විදුහල්පතිවරු මේ භාණ්ඩ මිලදී අරගෙන ප්‍රයෝජනයට ගන්නවා. අද වන තෙක් මේ භාණ්ඩ යථා තත්ත්වයෙන්, වැඩ කරන තත්ත්වයෙන් තිබෙනවාය කියන කාරණය අපි කියන්නට ඕනෑ. කෙසේ නමුත් මේකට කරන පරීක්ෂණ - විවිධ පරීක්ෂණ හරහා මේ අදාළ කටයුත්ත මෙහෙයවපු අයට විරුද්ධව දඬුවම් කරන්නේ නැතිව, විදුහල්පතිවරුන්ගේ වැටුප් කපා දාන්න නියෝගයක් යවනවා. මේ නියෝගය යවන්නේ පළාත් අධ්‍යාපන අමාත්‍යාංශයෙන්. විගණන විමසුමක් අනුව මේ නියෝගය යැව්වා කියලා කියනවා. විදුහල්පතිවරු පළාත් අධ්‍යක්ෂවරුන්ට, ලේකම්ට, අමාත්‍යාංශයට, සියලු දෙනාට විවිධ අභියාචනා කරනවා. මේ අසාධාරණ කටයුත්ත සිද්ධ කරන්න එපාය කියලා. නමුත් ඔවුන්ගේ පසුගිය මාසයේ වැටුපෙන් විශාල මුදලක් කපා දාලා තිබෙනවා. මේ අතර ගරු සභාපතිතුමනි, මම කියන්නට ඕනෑ. මේ සියලු තැන්වලදී ප්‍රශ්නය විසඳන්නේ නැතිකොට මේ විදුහල්පතිවරු ගරු ආණ්ඩුකාරතුමාගෙන් ඉල්ලීමක් කරනවා, මේ ප්‍රශ්නය විසඳලා දෙන්නය කියලා. ආණ්ඩුකාරතුමාගේ ලේකම්තුමා මේ ලිපියට අනුව, මේ අභියාචනයට අනුව 2013.05.14 වැනිදා පළාත් ලේකම්තුමාට ලිපියක් එවනවා, මේ සම්බන්ධයෙන් අවශ්‍ය කටයුතු කරන්න කියලා. විශේෂයෙන් මේ සම්බන්ධයෙන් පරීක්ෂා කොට ගන්නා ලද තීරණ විගණන විමසුමක් හෝ ගිණුම් කාරක සභා නියෝග ඇත්නම් එම තොරතුරු සමඟ ඔබගේ නිර්දේශ හා නිරීක්ෂණ ඇතුළත් වාර්තාවක් නොපමාව එවන ලෙස ගරු ආණ්ඩුකාරතුමාගේ උපදෙස් පරිදි දන්වනවාය කියලා පළාත් අධ්‍යාපන ලේකම්තුමාට ලිපියක් යවනවා. එහෙම යවලා තිබෙද්දී, මේ පරීක්ෂණය නැවත කරලා ආණ්ඩුකාරතුමාගේ නියෝගයක් එනකල් ඉන්නේ නැතිව තමයි වැටුප් කපා දැමීම සිද්ධ කරන්නේ.

ගරු සභපතිතුමනි, ඔබතුමා දන්නවා. පසුගිය මාසය වැටුප් නැති මාසයක්. අප්‍රේල් මාසේ වැටුප අප්‍රේල් මාසේ 10 වැනිදාට ගෙවනවා. ඊට පස්සේ රාජ්‍ය සේවකයෙක් නැවත වැටුපක් ලබන්නේ මැයි මාසේ 25 වැනිදා වන කොටයි. ඉතින් පසුගිය මාසයේම වැටුප් නැතිව ඉඳලා මේ මාසේ රු. 3000/- ක්, රු. 4000/- ක් වැටුප විධියට අතට ගන්න රජයේ සේවකයෙක් පත් වන මානසික අසහන තත්ත්වය ඔබතුමා දන්නවා. නමුත් වැටුප් කපන්න අවශ්‍ය චක්‍රලේඛ නිකුත් කරලා තිබෙනවා. තමන් ලබන වැටුපෙන් කොපමණ ප්‍රතිශතයක්ද වැටුපෙන් කපා දාන්න පුළුවන් කියලා ඒ චක්‍රලේඛවල පැහැදිලි කරලා තිබෙනවා. නමුත් එකවර රු. 17,000/- ක්, රු. 18,000/- ක් වාගේ අතිවිශාල ප්‍රමාණයක් කපා දැමීම නිසා ඔවුන්ගේ අතට වැටුප විධියට හම්බ වුණේ රු. 3000/- ක්, 4000/- ක්, රු. 5000/- ක්, රු. 6000/- වාගේ ඉතාම සුළු ප්‍රමාණයක්. හෝමාගම අධ්‍යාපන කලාපයේ විදුහල්පතිවරු 18 දෙනෙකුට මේ තත්ත්වය උදා වෙලා තිබෙනවා. ඒ නිසා මේ විදුහල්පතිවරු ඉන්නේ බරපතළ අසහනකාරී තත්ත්වයකින්. තමන්ගේ මාසික වැටුප නැතිව, තමන්ගේ මාසික තත්ත්වය කළමනාකරණය කර ගන්න බැරිව, මේ අය තමන්ගේ ජීවිත පිළිබඳව ඉතාම අවදානම් තත්ත්වයක තමයි ජීවත් වෙන්නේ. මම හිතන්නේ ඒ අයට පාසල් ඇතුළේ ගිහිල්ලා සේවය කරන්න පුළුවන් මානසික තත්ත්වයක් නැහැ.

ඒ නිසා මේක ඉතාම අසාධාරණ ක්‍රියාවලියක්. අසාධාරණ තීරණයක් සහ අසාධාරණ පිළිවෙතක් අනුගමනය කිරීම තුළ තමයි මේ කටයුත්ත සිද්ධ වුණේ. දඬුවම් කළ යුතු අය ඉතා පැහැදිලිව ඉන්දැද්දී, මේ නියෝග දීපු අය, මේ විදුහල්පතිවරුන්ට මේ ආයතනය ගෙනැල්ලා පෙන්වලා, මේ බඩු ගන්න promotion campaign කරපු එක ආදී ඒ සියල්ල පැහැදිලිව තිබෙද්දී අහිංසක විදුහල්පතිවරුන්ට දඬුවම් කරන්න කටයුතු කරලා තිබෙනවා. ඒ නිසා මේක අසාධාරණ ක්‍රියාමාර්ගයක්. ඒ නිසා මම ඔබතුමාගෙන් ඉල්ලා සිටිනවා. ඔබතුමා යම් නියෝගයක් දෙන්න. අධ්‍යාපන අමාත්‍යාංශයටත්, අධ්‍යාපන උපදේශක කාරක සභාවටත්, මේ පිළිබඳව නිවැරදි පරීක්ෂණයක් කරලා, තීන්දුවක් ගන්නා තෙක් මේ වැටුප් කපා දැමීම නතර කරලා, ඒ අයට හිමි නියම වැටුප ගෙවා දාන්න අවශ්‍ය පියවර ගන්නය කියලා. එහෙම නැති වුණොත් මේ පාසල් ඇතුළේ නිවැරදි සේවාවක් නොවෙයි සිද්ධ වන්නේ. ඔවුන් අතින් නිර්මාණය වන අනාගත පරපුර, ඉතාම වැරදි අතට යන්න පුළුවන්. ඒ පිළිබඳව ඔබතුමාගේ අවධානය යොමු කරන්නය කියන ඉල්ලීම කරනවා. බොහොම ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මම මේ අවස්ථාවේදී මහේෂ් අල්මේදා ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු කාරණය සම්බන්ධයෙන් වැඩ බලන ගරු මහ ඇමතිතුමාගේ අවධානයට යොමු කරනවා. ඒ පිළිබඳව කඩිනම් පියවර ගන්නා ලෙස.

**ගරු මංජු ශ්‍රී අරංගල - විපක්ෂ නායකතුමා**
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, අද රටේ විශාල වශයෙන් මාතෘකාවට බඳුන් වෙලා තිබෙන, සාමාන්‍ය මිනිස්සුන්ට දරන්න බැරි විදුලි බිල සම්බන්ධව යම් අදහසක් ප්‍රකාශ කිරීම සඳහා අවසර ලබා දීම සම්බන්ධයෙන් අපි ඔබතුමාට ස්තූතිවන්ත වෙනවා. අපි දන්නවා. මේ වන කොට විවිධ අංශ තුළින් මේ විදුලි බිල ඉහළ දැමීම සම්බන්ධව කථිකාවත් මතු වෙමින් යනවා. සාමාන්‍ය රාජ්‍ය සේවකයා, මැද පන්තියේ මනුස්සයා, නිෂ්පාදකයා, සුළු ව්‍යාපාරිකයා වාගේ උදවියට මේ විදුලි බිල දරා ගැනීමේ අපහසුව, අමාරුව තිබෙනවාය කියන එක මම හිතන්නේ කවුරුත් තමන්ගේ හෘද සාක්ෂියට අනුව කල්පනා කළොත් එය සත්‍යයක් කියන එක හැම කෙනෙක්ම වටහා ගන්නට ඕනෑ කාරණයක්. දැන් අපි දන්නවා. මේ විදුලි බිල්ලේදී මධ්‍යම පාන්තිකයා, විශේෂයෙන්ම ගෙදර දරුවන් දෙතුන් දෙනෙකු ඉන්න තැනක කොයි තරම් පිරිමැසුම් කරලා විදුලි බලය පාවිච්චි කරන්නය කියලා කිව්වත් සහනය ලැබෙන ප්‍රමාණයේ විදුලි යුනිට් ප්‍රමාණයකින් නවත්වා ගන්නට පුළුවන්කමක්, හැකියාවක් ඇත්තේ නැහැ.

අනෙක් පැත්තෙන් අපි මතක් කරන්නට කැමැතියි. මේ විදුලි බිල ඉහළ දාන්න, මහජන උපයෝගීතා කොමිෂන් සභාවට විවිධ පුද්ගලයෝ කැඳෙව්වා. විදුලි බිල කොයි ආකාරයෙන් වැඩි කිරීම සඳහා කටයුතු කළ යුතුද කියන එක කථා කරන්න. ඒ කැඳවලා මහජන උපයෝගිතා කොමිසමට දිගින් දිගට කිව්වා - ඒකට සහභාගීත්වය 98% ක් විතර. මේ විදුලි බිල මේ වෙලාවේ වැඩි කරන්න එපා. විවිධ බලපෑම්වලට යනවාය කියලා. නමුත් මිනිස්සුන්ගේ මතය අහගෙන, මිනිස්සු කියන දේ අහගෙන ඉඳලා ගොලුවන්, බීරන් වාගේ මහජන උපයෝගිතා කොමිසම මිනිස්සුන්ට දරන්න බැරි අධික වැය බරකට මේ විදුලි බිල තුළින් ඇදලා දාලා තිබෙනවා. දැන් අපි විතරක් නොවෙයි, ආණ්ඩුවේ ඉන්න යම් පාර්ශවයන් බැලුවත් හිටපු විදුලිබල අමාත්‍යතුමා පාඨලී චම්පික රණවක මැතිතුමාත් ප්‍රකාශයක් කළා, මේ විදුලි බිල මිනිස්සුන්ට දරන්න අමාරුයි කියන එක. ඒ නිසා ඇත්තෙන්ම ආණ්ඩුවේ පාර්ශවය වුණත් මැති ඇමතිවරු ගණනාවක් මේ වන කොට මාධ්‍යවලින් ජනතාවට ප්‍රකාශ කරලා තිබෙනවා, මේ විදුලි බිල දරා ගන්න අමාරුයි කියන එක. අනික් පැත්තෙන් මේ විදුලිබිල පිටිපස්සේ තවත් වැඩිවීම් එනවා. මේ වන කොට ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලය කියලා තිබෙනවා, මේ විදුලි බලය නිසා ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට මාසයකට ලක්ෂ 230 ක අමතර වැය බරක් දරන්න වෙලා තිබෙනවා කියලා. දැන් ජාතික ජල සම්පාදන හා ජලාපවාහන මණ්ඩලයට මේ කාරණය කියන්නේ මොකවත් නිසා නොවෙයි. මේ නිසාම ජාතික ජල සම්පාදන මණ්ඩලයට මේ බර දරන්න වෙනවා. මේ විදුලි බිල වැඩි වීම නිසා අනාගතයේ ජල ගාස්තුත් වැඩි වීමේ ප්‍රවණතාවයක් තිබෙනවාය කියන එක. ඒ නිසා අපි මතක් කරන්නේ. සාමාන්‍ය මිනිස්සු පිළිබඳව හිතන විධියට, සාමාන්‍ය මිනිස්සු ගැන කථා කරන විධියට මේ විදුලි බිල වැඩි වීම අපි කාටවත් හිතා ගන්න බැරි විධියට රජය විසින් කරලා තිබෙනවා. ඒ නිසා විශේෂයෙන්ම අද වෙලා තිබෙන්නේ, රජයේ ඇමතිවරුන්ගේ රු. 115,000/- ක, 120,000/- ක විදුලි බිලක් දැරුවත්, එතුමාට ගෙවන්න වෙලා තිබෙන්නේ රු. 2000 ක් වැනි සොච්චම් මුදලක්. අනික් පැත්තෙන් නාස්තිකාර විධියට විදුලිය මේ රටේ කොයිතරම් පරිභරනය කරනවාද කියන එක අපි මතක් කරන්නට ඕනෑ. ඒ නිසා අපි සාමාන්‍ය මිනිස්සු වෙනුවෙන් රජයට මේ වාගේ වෙලාවකදී මතක් කර සිටින්නේ, මේ අධික වැය බරක් දරා ගෙන මේ වන කොට මහජනතාව වෙත පටවලා තිබෙන විදුලි බිල මේ සාමාන්‍ය මිනිස්සු ගැන අනුකම්පාවෙන් කටයුතු කරලා ඒ විදුලි බිල අඩු කරන්නට කටයුතු කරන්නය කියන එකයි. ඒක මතක් කරමින් මගේ වචන ස්වල්ප අවසන් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ශ්‍රීනාත් මහේන්ද්‍ර පෙරේරා ගරු මන්ත්‍රීතුමාට විනාඩි 05 ක කාලයක් තිබෙනවා.

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එතුමා සභාවේ නැහැ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මීළඟට නෙලුක් මල්ලව ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව තිබෙනවා.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

ගරු සභාපතිතුමනි, රටේ වර්තමාන දේශපාලන තත්ත්වය පිළිබඳව ඇති වෙලා තිබෙන යම් යම් ව්‍යාකුල තත්ත්වයන් සම්බන්ධයෙන් කථා කරන කොට අංක 01 ට මට මතක් වෙනවා, පසුගිය කාලය තුළම විපක්ෂයේ දේශපාලන පක්ෂ මහා විළිරුදාවකින් මෙන් කන්දක් උපද්දවන්න වාගේ දඟළලා දඟළලා, මීයෙක් වදලා ඉන්න වෙලාවක විදුලි බිල වැඩි වීම සම්බන්ධයෙන් ඔවුන් බොහොම බරපතළ විවේචනවල යෙදෙමින්, බරපතළ උද්ඝෝෂණවල ඉඳිමින්, ජනතාවට දැනෙන උද්ඝෝෂණයකට රට කැන්දාගෙන ආවා. හැබැයි, එතුමාගේ කථාවේදීවත්, කොහේදීවත් වැඩ වර්ජනයක් ගැන කියා ගන්න පුළුවන් මට්ටමක් එතුමාට තිබුණේ නැහැ. කියවුණේත් නැහැ. කියන්නත් බැහැ. කියන්න තරම් ප්‍රතිඵලයකුත් නැහැ. ගරු සභාපතිතුමනි, එක් ලක්ෂ තිස් හත් දාහක් පසුගිය වැඩ වර්ජනයේදී දොට්ට දමපු එක්සත් ජාතික පක්ෂයට මොන වැඩ වර්ජනද? සෑම අවස්ථාවකදීම පුද්ගලිකකරණයට අවශ්‍ය කරන උඩගෙඩි දීලා - මේ වන කොට අපේ ලාල් කුලරත්න ගරු මන්ත්‍රීතුමාත් ඒ 80 වැඩ වර්ජනය තුළ බැට කාපු පුද්ගලයෙක්. ඒ නිසා මේ රටේ

කම්කරුවාට දෙන්න ඕනෑ සියලු බැට දුන්න එක්සත් ජාතික පක්ෂයත් අද කම්කරු අරගලයට ඇවිල්ලා තිබෙනවා. ඒ කම්කරු අරගලය විශ්වසනීය ලෙස වැළඳ ගන්න මේ රටේ ජනතාව සූදානම් නැහැ. වර්තමාන දේශපාලන තත්ත්වය තුළ.

[ ගරු නෙලුක් මල්ලව ]

ගරු සභාපතිතුමනි, මේ රටේ ජනතාව ඉන්නේ ජාතික උවමනාවත් එක්ක. ජාතික උවමනාවත් එක්ක ඉන්න ජනතාවට - විදුලි බිල කියන එක අපටත් පුද්ගලිකව දැනෙන දෙයක්. ඒ සියලු දේ අපට දැනෙනවා. ඒ නොදැණුනාට අද දවසේ මේ රටේ ඒකීයභාවය වෙනුවෙන් ක්‍රියාත්මක වන, මේ රටේ ජනතාවගේ ස්වාධීනත්වය, ස්වාධිපත්‍යය වෙනුවෙන් ක්‍රියාත්මක වන රජය පෙරළා දමන්න විපක්ෂයට ඔය ආකාරයේ බංකොලොත් සටන් පාඨවලින් ඉඩකඩ දෙන්නේ නැහැ, මේ රටේ ජනතාව. මේ රටේ ජනතාව බොහොම පැහැදිලිවම විදුලිබිල සම්බන්ධයෙන් රජයේ යෝජනාවට එකඟ නැහැ. ඒක අපි පිළිගන්නවා. නමුත් ඒක තුළ ආණ්ඩුව ගෙදර යවන්න සූදානමකුත් නැහැ. ට්‍රාන්ස්ෆෝමර් 5700 ක් ගිනි තියලා, මේ රටේ විදුලිය සම්පූර්ණයෙන් විසන්ධි වෙන්න කටයුතු කරපු ජනතා විමුක්ති පෙරමුණයි මේ විදුලි බලය ගැන කථා කරන්නේ. එදා දවසේදී ගරු සභාපතිතුමනි, මේ රටේ සම්පූර්ණ විදුලි නඩත්තුව විදුලි බල මණ්ඩලයට ගියේ ජනතා විමුක්ති පෙරමුණ ඒ කරපු විනාශය නිසයි.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඔබතුමාත් ඇතුළේ ඉන්න කොට.

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

නැහැ. මම කවදාවක්වත් ඉඳලා නැහැ. ඒ නිසා ඒ නඩත්තු කටයුතුවලට අදාළ වියදම ගෙව්වේ කවුද? මේ රටේ ජනතාව ගෙව්වේ. ට්‍රාන්ස්ෆෝමර් 5700 ක් ගිනි තියපු ජනතා විමුක්ති පෙරමුණේ බිල ගෙව්වේ මේ රටේ අහිංසක ජනතාව. ඒ නිසා මම බොහොම පැහැදිලිව කියනවා. කම්කරුවාගේ උවමනාව, කම්කරුවාගේ අවශ්‍යතාවය, කම්කරුවාගේ කුසගින්න දැනෙන්නට ඕනෑ කම්කරු විඥානයට සමපාතව හිතන දේශපාලන පක්ෂවලට විතරයි. ඒ දේශපාලන පක්ෂය ඉන්නේ වර්තමාන රජයත් එක්ක. කම්කරු උවමනාවට අනුව කම්කරු අරගල කරලා ඉතිහාසයක් තිබෙන, කම්කරුවා වෙනුවෙන් කම්කරුවාට ජීවය දුන්න, පණ දුන්න දේශපාලන පක්ෂ ඉන්නවා නම්, ඒ ඉන්නේ අද ආණ්ඩු පක්ෂයත් එක්ක. ඒ නිසා ගරු සභාපතිතුමනි, මේ වේලාවේදී එක්සත් ජාතික පක්ෂය ප්‍රමුඛ විපක්ෂයේ බලවේග මේ කරගෙන ගිය බංකොලොත් වැඩ වර්ජනය පරාජය කළ මේ රටේ ජනතාවට මම ස්තුතිවන්ත වෙනවා. සියලුම වැඩ කරන ජනතාව අද සෞඛ්‍ය ක්ෂේත්‍රය ගත්තත්, අධ්‍යාපන ක්ෂේත්‍රය ගත්තත්, ප්‍රවාහන ක්ෂේත්‍රය ගත්තත් සෑම තැනකම කම්කරුවෝ අද වන කොට සක්‍රීයව තමන්ගේ රාජකාරීවල යෙදිලා සිටිනවා. ඒ නිසා මේ සභා ලේකම් කාර්යාලය ප්‍රමුඛ සියලු නිලධාරී මණ්ඩලයට, ඒ වාගේම රාජ්‍ය සේවකයන්ට අද දවසේදී ජාතික ධජය අත දරාගෙන යන්නා වූ මේ රජය පෙරළා දමන්නට දරන්නා වූ ඒ සටකපට වෑයම පරාජය කරන්න මැදිහත් වීම සම්බන්ධයෙන් මගේ හෘදයාංගම ස්තුතිය පුද කරමින් මා නිහඬ වෙනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී උදෑසන තේ විවේකය සඳහා සභාව විනාඩි 15 කට කල් තබනවා.

***ඊට අනුකූලව පළාත් සභාව තාවකාලිකව අත්සිටුවන ලදින් පූ.භා. 11.33 ට යළිත් රැස්විය.***

*Sitting, accordingly suspened untill 11.33 a.m. and then resumed.*

# පළාත් සභාවේ කටයුතු - I
PROVINCIAL COUNCIL AFFAIRS - I

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"අද දින පොදු කටයුතු ප්‍රමුඛතාවය ගත යුතුය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# පළාත් සභාවේ කටයුතු - II
PROVINCIAL COUNCIL AFFAIRS - II

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, *"2013.05.08 වන දින පැවැති සභා කටයුතු පිළිබඳ කාරක සභා රැස්වීමේ දී එළඹුණු එකඟතාවයට අනුව අද දින න්‍යාය පත්‍රයේ පොදු කටයුතු විෂයයේ වැඩ කටයුතුවල කාර්ය අනුපිළිවෙළ පිළිවෙළින් විෂයය අංක 02, 03 හා 01 වන පරිදි විය යුතු යැයි සලකා ක්‍රියා කළ යුතුය"* යන යෝජනාව මම ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය : පළමුවර කියැවීම
INDIGENOUS MEDICAL STATUTE : FIRST READING

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, ප්‍රඥප්ති කෙටුම්පත සංශෝධිතාකාරයෙන් තමයි ඉදිරිපත් කරන්නේ. එනම්, *"බස්නාහිර පළාතේ පළාත්*

*සභාවේ 2013 අංක ..... දරන දේශීය වෛද්‍ය ප්‍රඥප්තිය පළමුවර කියැවීම සඳහා මම සභාවට ඉදිරිපත් කරනවා."*

***සංශෝධිත ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Amended, Question proposed*
**** [පූර්විකාව]***
*[Preamble]*

**හේමන්ත සමරකෝන් මහතා**
Mr. Hemantha Samarakoon

ගරු සභාපතිතුමාගේ නියමය පරිදි ප්‍රඥප්තියේ පූර්විකාව වූ, *"ශ්‍රී ලංකා ප්‍රජාතාන්ත්‍රික සමාජවාදී ජනරජයේ ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවේ නව වැනි උපලේඛනයේ I වැනි ලැයිස්තුවේ සඳහන් "දේශීය වෛද්‍ය කටයුතු" විෂය ක්‍රියාත්මක කරමින් දේශීය වෛද්‍ය ක්‍රමය උපයෝගී කොට බස්නාහිර පළාතේ ජනතාවගේ රෝග නිවාරණය, රෝග ව්‍යුපසමනය, සෞඛ්‍ය අධ්‍යාපනය සහ දේශීය වෛද්‍ය ප්‍රජා සෞඛ්‍ය සේවා ආරම්භ කර පවත්වාගෙන යාම, දේශීය වෛද්‍ය කටයුතු ප්‍රවර්ධනය හා සංරක්ෂණය කිරීම, දේශීය වෛද්‍ය ආයතන පිහිටුවීම, පවත්වාගෙන යාම, සංවර්ධනය කිරීම හා ඊට අවශ්‍ය පහසුකම් සැපයීම සඳහාත්, ඔසු උයන් ආරම්භ කර පවත්වාගෙන යාම හා ව්‍යාප්ත කිරීම සඳහාත්, බස්නාහිර පළාතේ දේශීය වෛද්‍ය ආයතන හා දේශීය වෛද්‍ය සේවා නියුක්තිකයන් ලියාපදිංචි කිරීම හා එම කටයුතු නියාමනය හා අධීක්ෂණය කිරීම සඳහාත්, ඊට අදාළ හා ආනුෂාංගික වූ කරුණු සඳහාත්, විධි විධාන සැලැස්වීම පිණිස වූ ප්‍රඥප්තියකි. මෙම ප්‍රඥප්තියේ විධි විධාන 1961 අංක 31 දරන ආයුර්වේද පනත හා අනනුකූල වේ. "*

යන පාඨය මම මෙම සභාව හමුවේ ප්‍රකාශ කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

සභා රීති ප්‍රකාරව ප්‍රඥප්තියේ පළමුවර කියැවීමේ වැඩ කටයුතු දැන් නිමා වුණා. මීළඟට එම ප්‍රඥප්තිය දෙවැනි වර කියැවීම සඳහා දිනයක් නියම කළ යුතුව තිබෙනවා. ඒ සඳහා අවස්ථාව.

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා –** විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරලා විවාදයට ගනිමු.

**ගරු රේණුක දුෂ්‍යන්ත පෙරේරා –** ආණ්ඩු පක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. Renuka Dushyantha Perera - Chief Government Whip

ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරලා දෙවන වර කියවමු.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

එහෙම නම් කාරක සභාවට ඉදිරිපත් කරලා දෙවන වර කියැවීම සඳහා දිනයක් නියම කරගත්තොත් හොඳයි. ගරු ඇමැතිතුමා දිනයක් යොදා ගත්තොත් ලෙහෙසියි.

**ගරු ජගත් අංගගේ –** අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ගරු සභාපතිතුමනි, එළඹෙන සභාවට පසුව එළැඹෙන සභා රැස්වීමට එනම්, ඊළඟ දෙවැනි පළාත් සභා රැස්වීමට දෙවන වර කියැවීමට හැකි වන පරිදි ප්‍රඥප්ති හා නීති කාරක සභාවට යොමු කරලා එම කාරක සභාවේ නිර්දේශ සමග අදාළ රැසවීම් දිනට ඉදිරිපත් කරන්න යෝජනා කරනවා. දෙවැනි රැස්වීමට.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ජූනි මස දෙවැනි සභාවට.

# පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම : 2012 වර්ෂය

AMENDING THE LIMITS OF THE PROVINCIAL COUNCIL ADVANCE ACCOUNTS : YEAR 2012

**ගරු ජගත් අංගගේ –** අමාත්‍යතුමා [ගරු ප්‍රධාන අමාත්‍යතුමා වෙනුවෙන්]
Hon. Jagath Angage - Minister [On Behalf of Chief Minister]

ගරු සභාපතිතුමනි, " *"පළාත් සභා අත්තිකාරම් ගිණුම්වල සීමා සංශෝධනය කිරීම - 2012 " නමැති උපලේඛනයේ දැක්වෙන පරිදි අත්තිකාරම් සීමාවන් සංශෝධනය කිරීමේදී, 2011 අංක 06 දරන විසර්ජන ප්‍රඥප්තියේ 07 වන වගන්තියේ විධිවිධාන ප්‍රකාරව කටයුතු කර ඇති හෙයින්ද,*

*එම සංශෝධනයන් සිදු කිරීම සඳහා පළාත් අමාත්‍ය මණ්ඩලයේ අනුමැතිය සභාවේ අනුමැතියට යටත්ව ලබා දී ඇති හෙයින්ද,*

*එම උපලේඛනයේ දැක්වෙන පරිදි, එක් එක් අත්තිකාරම් ගිණුම්වල සීමාවන් සංශෝධනය කිරීම මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව අනුමත කළ යුතුය."* යන යෝජනාව ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

# ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය : දෙවන වර කියැවීම

RURAL DEVELOPMENT STATUTE : SECOND READING

**ගරු උපාලි කොඩිකාර** (ප්‍රවාහන, ක්‍රීඩා හා තරුණ කටයුතු, සංස්කෘතික හා කලා කටයුතු, සමුපකාර සංවර්ධන, ආහාර සැපයීම් හා බෙදා හැරීම් කටයුතු සහ ග්‍රාම සංවර්ධන අමාත්‍යතුමා)
Hon. Upali Kodikara (Minister of Transport, Sports and Youth Affairs, Cultural and Arts Affairs, Cooperative Development, Food Supplies and Distribution and Rural Development)

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාත් සභාවේ 2011 අංක ...... දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය[1] දෙවන වර කියැවීම සඳහා මෙම සභාවට ඉදිරිපත් කරනවා."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමතිතුමාගේ යෝජනාවට අනුව, බස්නාහිර පළාතේ 2011 අංක ... දරණ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය දෙවනවර කියැවීමේ අවස්ථාව එළඹ තිබෙනවා. ඒ සම්බන්ධයෙන් ඔබතුමන්ලා වෙත 2013.04.09 වන දින සභාගත කරන ලද 2013.03.05 දිනැති ප්‍රඥප්තිය හා නීති කාරක සභාවේ නිර්දේශ පිළිබඳවද ඔබතුමන්ලාගේ අවධානය යොමු කරන මෙන් කාරුණිකව දැනුම් දෙනවා.

ඒ අනුව ප්‍රඥප්ති කෙටුම්පතේ සියලු වගන්ති සංශෝධනය කිරීමට නිර්දේශ කර ඇති අතර එකී ප්‍රඥප්ති කෙටුම්පතේ ව්‍යුහාත්මක වෙනස්කම්ද සිදු කිරීමට නිර්දේශ කර තිබෙනවා. එම සංශෝධන ඇතුළත් කොට 2013 ප්‍රඥප්ති කෙටුම්පත යනුවෙන් හැඳින්වෙන ලේඛනයට ඇතුළත් කර ඇති බවද කාරුණිකව දැනුම් දෙනවා. එය මෙදින න්‍යාය පත්‍රයට අමුණා තිබෙනවා. තවදුරටත් අවශ්‍ය සංශෝධන ගරු මන්ත්‍රීවරුන්ට පූර්ණ කාරක සභා අවස්ථාවේදී ඉදිරිපත් කිරීමට අවස්ථාව ලැබෙන බවත් කාරුණිකව දැනුම් දෙනවා.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ගරු සභාපතිතුමනි, මෙම ප්‍රඥප්තිය ඉදිරිපත් කිරීම පිළිබඳව ඇත්ත වශයෙන්ම අපි ගරු ඇමැතිතුමාට ස්තුතිවන්ත වෙනවා. ගරු සභාපතිතුමනි, ප්‍රඥප්තිය සම්බන්ධයෙන් ප්‍රඥප්ති හා නීති කාරක සභාවත් යම් යම් සංශෝධන සහිතව ඉදිරිපත් කරලා තිබුණත්, අපට අදහස් කීපයක් ප්‍රකාශ කරන්න ලැබීම ගැන මම සන්තෝෂ වෙන්න ඕනැ. ග්‍රාම සංවර්ධන සමිතිය මුලින්ම නාමිකව වාගේ අපට තිබුණේ. ඒකයි මම ගරු ඇමැතිතුමාට ස්තුති කළේ. දැන් අපි පළාත් සභාවක් හැටියට ඒක දෙපාර්තමේන්තුවක් කරන්න ගරු ඇමැතිතුමා මැදිහත් වෙලා ඒ කටයුතු කරලා තිබෙනවා. මම දැක්කා පුවත්පත්වල එතුමාගේ ෆොටෝ එකක් දාලා ඉදිරි වැඩ පිළිවෙළකුත් සකස් කරලා තිබුණා. එක අවස්ථාවක මට යම්කිසි පෙත්සමක් වගෙත් ආවා. ගරු ඇමැතිතුමා යම් යම් නිලධාරීන් සම්බන්ධයෙන් තීරණ ගත්තත් ගරු ඇමැතිතුමා ඒ නිලධාරීන් පිළිබඳව ගත්තු තීරණ පවා ක්‍රියාත්මක කරලා තිබුණේ නැහැයි කියලා. ගරු ඇමැතිතුමාට මම පෞද්ගලිකව දවසකුත් කිව්වා. ඔබතුමාගේ වරදක් නැහැ. චෝදනාවක් නොවෙයි. ඔබතුමා උත්සාහ කරලා තිබෙනවා. මහන්සි වෙලා තිබෙනවා.

විශේෂයෙන්ම කියන්න ඕනැ, ග්‍රාම සංවර්ධන සමිතියේ නිලධාරී මහත්වරු අනුයුක්ත වුණේ රේඛීය අමාත්‍යාංශයේ සේවය කරපු කොටසටමයි. මෙයටමයි අනුයුක්ත වෙලා තිබුණේ. ඒ අයගේ අයිතිවාසිකම්, වරප්‍රසාද ලබා දෙන්න, ගරු ඇමැතිතුමා උත්සාහ කළත් යම් යම් අවස්ථාවලදී ඒවාට ඉඩ ලැබිලා නැහැ. ඒ මැසිවිල්ල තවමත් තිබෙනවා. ඒ නිසා අපි මේ ප්‍රඥප්තිය සම්මත කිරීමෙන් පසුව හරි කමක් නැහැ ගරු ඇමැතිතුමනි, ඒ සේවා තත්ත්වය සැලකිල්ලට ගන්න, (බාධා කිරීමක්) ඔබතුමාට බලය නැති වුණත්, කියලා තිබුණා මේවා කරන්න ඕනැ කියලා. දැන් මාස ගණනකට උඩදී මට ඒකේ ප්‍රකාශන පවා ලැබිලා තිබුණා. ඒ නිසා මේ නිලධාරීන්ගේ සේවා කාලය සැලකිල්ලට ගැනීමක් සිද්ධ කරන්න වෙනවා. ඒ සේවා කාලය සැලකිල්ලට අරගෙන ඒ අයගේ පත්වීම් - ඔවුන්ට නැවත තනතුර ලබා දීමේදී, උසස්වීම් ලබා දීමේදී, යම් යම් තනතුරුවලට පත් කිරීමේදී ඒ නිලධාරීන් ගැන විශේෂයෙන් ඔබතුමාගේ කාරුණික අවධානය යොමු කරන්න කියන එක පිළිබඳවයි, මම විශේෂ ඉල්ලීමක් කරන්නේ. ඒ අයගේ ඒ උසස්වීමත් එක්කම යම් දීමනාවක් පවා සංශෝධනය කරගන්න වෙනවා. ප්‍රායෝගිකව ඒක ඔබතුමාට පුළුවන් වේවි. විශේෂයෙන්ම මේ ප්‍රඥප්තිය ක්‍රියාත්මක කිරීමේදී ඒ වාගේ නිලධාරීන්ගේ මට්ටමින් පමණක් නොවෙයි. ජනතාවටත් මේ සුභ සාධනය වන විධියට මේ වැඩ පිළිවෙළ ගැන දැඩි අවධානය යොමු කරගන්න ඕනැ. ග්‍රාම සංවර්ධන ගම්මාන පවා පිහිටුවන්න කථා කරලා තිබුණා. යම් යම් අවස්ථාවලදී ක්‍රියාත්මක වෙලා තිබුණා. නමුත් මේ අවශ්‍ය ප්‍රතිපාදන පිළිබඳව අවධානය යොමු කරන්න වෙනවා. ග්‍රාම සංවර්ධන සමිති අද ඊයේ නොවෙයි. අවුරුදු ගණනාවක් තිස්සේ, රජකාලේ ඉඳලා එන එකක්. නිල වශයෙන්ම එක අමාත්‍යවරයෙක් පවා පත් කරලා එය ක්‍රියාත්මක කරගෙන පැමිණි වැඩ පිළිවෙළක්. පළාත් සභාවේ 13 වැනි සංශෝධනය ක්‍රියාත්මක කිරීමේදී, ග්‍රාමීය ජනතාවත් එක්ක ග්‍රාමීය ජනතාවට දැනෙන වැඩ පිළිවෙළක් ක්‍රියාත්මක කරන්න පුළුවන් දෙපාර්තමේන්තුවක් වෙන්නත් ඕනැ. නාමිකව දෙපාර්තමේන්තුවක් වෙලා වැඩක් වෙන්නෙත් නැහැ. ග්‍රාම සංවර්ධන සමිති මගින් ඔබතුමා හොඳ වැඩ පිළිවෙළක් කළා. ගම්මාන වැඩ පිළිවෙළ. ග්‍රාමීය ජනතාවගේ අඩුපාඩුකම්, අවශ්‍යතාවයන් හඳුනාගෙන ගම්මාන වැඩ පිළිවෙළ ක්‍රියාත්මක කරන කොට ජනතා සහභාගීත්වය වාගේම, යොදවන ප්‍රතිපාදන පවා නිසි ලෙස ඵලදායිතාව පිළිබඳවත් අපට හිතන්න ඕනැ. මේ ප්‍රඥප්තියේ අඩුපාඩුකම් සම්පූර්ණ වනකොට - විශේෂයෙන්ම මේ ප්‍රඥප්තියේ නිලධාරීන් පිළිබඳව තමයි කොහොමටත් සංශෝධනය වෙන්නේ. ඒ වාගේ පත් කරන විට දිස්ත්‍රික් මට්ටමේ අධ්‍යක්ෂවරු පත් කරගන්න පුළුවන් නම්, දිස්ත්‍රික් තුනට ප්‍රධානීන් තුන් දෙනෙකුයි. ප්‍රධාන අධ්‍යක්ෂවරයෙක්. ග්‍රාම සංවර්ධන දෙපර්තමේන්තුවට ප්‍රධානියෙක් එක්ක පත් කරලා ක්‍රියාත්මක කිරීමේදී ඒ ගැනත් ඔබතුමාගේ අවධානය යොමු කරන්න වෙනවා. ඒ වාගේම ග්‍රාම සංවර්ධන සමිතියේ වැඩ පිළිවෙළ තුළ ඒ කටයුත්ත කරගෙන යන්න විශේෂයෙන්ම පනත සම්මත කරලා මදී. ක්‍රියාත්මක කිරීම පිළිබඳව, ඒ වාගේම ඔබතුමාට වාර්ෂිකව

[1] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

මේ සභාවට වාර්තාවක් දෙන්න පුළුවන් නම් ඇගයීමක් කර ගත හැකි වෙනවා. ගරු සභාපතිතුමනි, ස්තුතිවන්ත වෙනවා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, අද ඉදිරිපත් කරන මේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තියට සංශෝධන කීපයක් තිබෙනවා. උපදේශක කාරක සභාවේ අපේ ගරු මන්ත්‍රීවරු ඉදිරිපත් කරපු. ඒ අනුව 2012.01.17 වන දින මෙම ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියවීම සිදු කළා. එදිනම මෙම කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කළා. ප්‍රඥප්ති කාරක සභා රැස්වීම වාර කිහිපයකදීම මෙම ප්‍රඥප්ති කෙටුම්පතට විවිධ සංශෝධන රැසක් එකතු කර තිබෙනවා. එම සංශෝධන හේතුවෙන්, පළමුවර කියවන ලද ප්‍රඥප්තිය ව්‍යුහාත්මක වෙනසක් වී තිබෙනවා. පළමුවර කියවන ලද ප්‍රඥප්තියේ මුල් අන්තර්ගතයේ හරයට අගතියක් නොවන පරිදි කරුණු වෙනස් වී තිබෙනවා. ඒ අනුව 2012.01.17 දින පළමු වර කියවන ලද ප්‍රඥප්තියට, ප්‍රඥප්ති හා නීති කාරක සභාවෙන් යෝජනා කරන ලද සංශෝධන ඇතුළත් කර, විධිමත්ව සකසා මෙම සභාවට 2013.03.05 දිනැති වාර්තාවේ ඇමුණුමක් ලෙස සභාගත කරන ලද සංශෝධිත කෙටුම්පතේ අන්තර්ගත සංශෝධනයන් පිළිගත යුතු බව මා සභාවට යෝජනා කර සිටිනවා. ඒ අනුව ප්‍රඥප්ති හා නීති කාරක සභාව ඉදිරිපත් කරපු සංශෝධන ඇතුළත් එම ලේඛනයේම වගන්තිවලට යළිත් සංශෝධන කීපයක් දෙවනවර කියවන විට ඉදිරිපත් කරන්න බලාපොරොත්තු වෙනවා.

දැන් බලන්න අපි බැලුවොත් ගරු සභාපතිතුමනි, අපේ සණස ව්‍යාපාරය. සර්වෝද ව්‍යාපාරය. එතකොට මේ වාගේ ව්‍යාපාර ගත්තාම මේ ග්‍රාම සංවර්ධන විෂයය සම්බන්ධව ගම ශක්තිමත් කරන්න ඕනෑ නම් ග්‍රාම සංවර්ධන බැංකුවක් අවශ්‍ය වෙනවා. ග්‍රාම සංවර්ධන බැංකුවක් තිබෙනවා නම් කණ්ඩායම් හදන්න පුළුවන්. ස්වයං රැකියා ණය දෙන්න පුළුවන්. ගමේ යටිතල පහසුකම් දියුණු කරන්න පුළුවන්. පෙර පාසල්, Day care center, ඒ වාගේම භාෂා පරිවර්තන පන්ති මේ වාගේ දේවල් ඕනෑ දෙයක් කරන්න පුළුවන්. සංස්කෘතික අංග. ඉතින් මේ සියල්ලක්ම කරන්න පුළුවන්. ඒ කරන්න පුළුවන් මුදලක් අපේ නැහැ. අපට මේ විෂය සම්බන්ධව වැය ශීර්ෂයක් නැහැ. එතකොට මම මේ දෙපාර්තමේන්තුව පිහිටුවාට පස්සේ අපට වැය ශිර්ෂයක් වෙනම වෙන් කරගන්න පුළුවන්කම ඇති වෙනවා, අපේ ප්‍රධාන අයවැයෙන්. එතකොට ඒක අනුව අපට මේ සභාවේ මන්ත්‍රීවරුන්ට ගමට විශාල වැඩ කොටසක් කරන්න පුළුවන් ශක්තියක් ලැබෙනවා. එතකොට සාමාජිකත්වයක් දීලා, අර බැංකුවක් පිහිටෙව්වාම ඒ බැංකුව තුළ රැදෙන සාමාජිකයා තමාට ගෙයක් හදා ගන්න, තමාට ස්වයං රැකියාවක් කරගන්න, තමාට ව්‍යාපාරයක් පටන් ගන්න, තමාට යම් සුභ සාධන වැඩ පිළිවෙළක් කරගන්න පුළුවන් හැකියාවක් ඇති වෙනවා. ඉතින් මේ අනුව මම ඒ සංශෝධනය ගෙනෙනවා. ඊට අමතරව තව සංශෝධන රාශියක් තිබෙනවා. ඒවා දෙවන වර කියවන විට ඉදිරිපත් කරනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

හොඳයි. ගරු ඇමැතිතුමනි, ඔබතුමා සංශෝධන පසුව කරන්න. පූර්ණ කාරක සභාවට පස්සේ.

බස්නාහිර පළාත් සභාවේ 2013..... අංක දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සම්බන්ධයෙන් එම කෙටුම්පත හරියාකාරව ඉදිරිපත් කරලා තිබෙනවා. ඒ නිසා තවදුරටත් ඒ සම්බන්ධව සාකච්ඡා කිරීමට මෙම සභාව පූර්ණ කාරක සභා තත්ත්වයට පත් වෙනවා ඇත.

***ඊට අනුකූලව පළාත් සභාව පූර්ණ කාරක සභාව බවට පරිවර්තනය විය.***

*Accordingly, the Provincial Council resolved itself into a Committee of the whole Council.*

# පූර්ණ කාරක සභාව
COMMITTEE OF THE WHOLE COUNCIL

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දැන් සභාව පූර්ණ කාරක සභා අවස්ථාවේ පසු වෙනවා. ගරු ඇමැතිතුමාට මෙම අවස්ථාවේ සංශෝධන ඉදිරිපත් කරන්න හැකියාව තිබෙනවා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

2012.01.17 දින මෙම ප්‍රඥප්ති කෙටුම්පත පළමුවර කියවීම සිදු කළා. එදිනම මෙම කෙටුම්පත ප්‍රඥප්ති හා නීති කාරක සභාවට ඉදිරිපත් කළා.

ප්‍රඥප්ති කාරක සභා රැස්වීම් වාර කීපයකදීම මෙම ප්‍රඥප්ති කෙටුම්පතට විවිධ සංශෝධන රැසක් එකතු කර තිබෙනවා.

එම සංශෝධන හේතුවෙන්,

පළමුවර කියවන ලද ප්‍රඥප්තියේ ව්‍යුහය වෙනස් වී තිබෙනවා.

පළමුවර කියවන ලද ප්‍රඥප්තියේ මුල් අන්තර්ගතයේ හරයට අගතියක් නොවන පරිදි කරුණු වෙනස් වී තිබෙනවා.

ඒ අනුව 2012.01.17 දින පළමුවර කියවන ලද ප්‍රඥප්තියට, ප්‍රඥප්ති හා නීති කාරක සභාවෙන් යෝජනා කරන ලද සංශෝධන ඇතුළත් කර, විධිමත්ව සකසා මෙම සභාවට 2013.03.05 දිනැති වාර්තාවේ ඇමුණුමක් ලෙස සභාගත කරන ලද සංශෝධිත කෙටුම්පතේ, අන්තර්ගත සංශෝධනයන් පිළිගත යුතු බව මා යෝජනා කර සිටිනවා.

එකී ඇමුණුමේ සඳහන් එකී සංශෝධනයන්ට අමතරව එකී ඇමුණුමට පහත සංශෝධනයන්ද එකතු කළ යුතු බව තවදුරටත් මා විසින් යෝජනා කර සිටිනවා.

2 වන වගන්තියේ (උ) වගන්තිය අවසානයට පහත වාක්‍යයද එකතු විය යුතු බව මම යෝජනා කරනවා.

*"අධීක්ෂණයට අමතරව සාමාජිකයන්ගේ මුදල් වල සුරක්ෂිතභාවය උදෙසා ග්‍රාම සංවර්ධනය සඳහා වූ බැංකු*

[ ගරු උපාලි කොඩිකාර - අමාත්‍යතුමා ]

*පිහිටුවීම. එහි පාලන බලය ග්‍රාම සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම් වෙත පැවරේ. ඒ අනුව ප්‍රාදේශීය මට්ටමින් හා දිස්ත්‍රික් මට්ටමින් ග්‍රාම සංවර්ධනය සඳහා වූ බැංකු පිහිටුවනු ලැබේ. එකී බැංකුවල අතිරික්ත අරමුදල් රාජ්‍ය බැංකුවක තැම්පත් කළ යුතුවේ."*

*6 වන වගන්තියේ 4 වන අනු වගන්තියේ (අ) යන්න මෙසේ සංශෝධනය විය යුතුයි. "මෙම ප්‍රඥප්තියේ (II) දෙවන උපලේඛනයේ සඳහන් ආකෘතියේ පරිදි වූ සමිතිය ලියාපදිංචි කිරීමේ ඉල්ලුම්පත්‍රය" මෙම ප්‍රඥප්තිය පළමුවර කියවන ලද අවස්ථාවේ 1සිට 6 දක්වා වූ සියලුම උපලේඛන සභාගත කර තිබෙනවා.*

*6 වන වගන්තියේ 4 වන අනුවගන්තියේ අවසන් ජේදයේ, "ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂකට පිටපතක් සහිතව" යන වචනවලින් පසු, "මෙම ප්‍රඥප්තියේ VI උපලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි වූ" යන වචන එකතු විය යුතුයි.*

*7 වන වගන්තියේ 3 වන අනුවගන්තියේ "මෙකී ප්‍රාදේශිය බල මණ්ඩල උදෙසා" යන වචනවලින් පසු, "මෙම ප්‍රඥප්තියේ III වන උපලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි වූ" යන වචන එකතු විය යුතුයි.*

*7 වන වගන්තියේ 7 වන අනු වගන්තියේ, "මෙකී ග්‍රාම සංවර්ධන දිස්ත්‍රික් බල මණ්ඩල උදෙසා" යන වචනවලට පසු, "මෙම ප්‍රඥප්තියේ IV උපලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි වූ" යන වචන එකතු විය යුතුයි.*

*8 වන වගන්තියේ 3 වන අනුවගන්තියේ, "මෙකී ග්‍රාම සංවර්ධන සමිති පළාත් බල මණ්ඩල උදෙසා" යන වචනවලට පසු, "මෙම ප්‍රඥප්තියේ V උපලේඛනයේ සඳහන් ආකෘතිය පරිදි වූ" යන වචන එකතු විය යුතුයි.*

*10 වන වගන්තියේ 1 වන අනුවගන්තියේ "සමිති අකදියට ඇති විටක හෝ" යන්නෙහි "අක්‍රීයව" යන වචනයේ අක්ෂර වින්‍යාසය නිවැරද විය යුතුයි.*

ඒ කියන්නේ අකුරක වැරැද්දක් තිබෙනවා. ඒක නිවැරැදි කරන්න.

2013.03.05 දිනැති වාර්තාවේ ඇමුණුමක් ලෙස ඇති සංශෝධන ඇතුළත් ලේඛනයේ ඇති පළමු උපලේඛනයේ සඳහන් කරුණු පිළිගත යුතු බව මම යෝජනා කරනවා.

*එම උපලේඛනයේ තිත් මගින් දක්වා ඇති (Bullets) සියලු කරුණු එම උපලේඛනයේ 4 හා 5 වගන්ති වල අනු කරුණු අංකනය කර ඇති ආකාරයට රෝම ඉලක්කම්වලින් අංකනය විය යුතු බව මම යෝජනා කරනවා.*

*අද දින න්‍යාය පත්‍රයේ බස්නාහිර පළාත් සභාවේ 2011 අංක ...... දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්ති කෙටුම්පත සමග සභාගත කළ අංක II සිට IV දක්වා උපලේඛන අමුණා තිබෙනවා. එම උපලේඛනවල සමහර තැන් පහත සඳහන් වන පරිදි සංශෝධනය කිරීමට යෝජනා කරනවා.*

*II උපලේඛනයේ සඳහන් කරුණු පිළිගත යුතු බව මම යෝජනා කරනවා.*

*III වන උපලේඛනයේ අංක "5: ව්‍යුහය" යන්න "5.ව්‍යුහය, සාමාජිකත්වය, ධූර කාලය" ලෙස සංශෝධනය විය යුතු බව මම යෝජනා කරනවා.*

*III වන උපලේඛනයේ 5 වන අංකය යටතේ ඇති 4 වන අනු අංකයේ සඳහන් "භාණ්ඩාගාරික වශයෙන්" යන වචන "භාණ්ඩාගාරික වරයෙක්" ලෙස වෙනස් විය යුතු බවට මම යෝජනා කරනවා.*

III වන උපලේඛයේ පස් (5) වන කොටසේ පස් (5) වන අනු අංකය යටතේ ඇති දෙවන වාක්‍යය ඉවත් කර ඒ වෙනුවට පහත වාක්‍ය ආදේශ විය යුතු බව මම යෝජනා කරනවා.

*"නමුත් ග්‍රාම සංවර්ධන ප්‍රාදේශිය බල මණ්ඩලයේ තේරී පත්වූ සභාපතිවරයාගේ නිල කාලය ඔහු නියෝජනය කරන ග්‍රාම සංවර්ධන සමිතියේ නිල කාලයට සමාන වන්නේය, ප්‍රාදේශිය බල මණ්ඩලයේ නිල කාලයට පෙරාතුව සභාපතිගේ නිල කාලය අහෝසි වන්නේ නම් ප්‍රාදේශිය බල මණ්ඩලයේ ඉතිරි කාලය සඳහා වෙනත් සමාජිකයෙකු සභාපති ලෙස පත් කළ හැක. "*

III වන උපලේඛයේ 12 වන වගන්තියේ '12(1)' යන්න '10(2)' ලෙස සංශෝධන විය යුතු බව මා යෝජනා කරනවා.

IV වන උපලේඛනයේ අංක "5:ව්‍යුහය" යන්න "ව්‍යුහය සාමාජිකත්වය හා ධූර කාලය" ලෙස සංශෝධනය විය යුතු බව මා කියා සිටිනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු ඇමැතිතුමා ධූර කාලය කොපමණද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

Two years.

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

ධූර කාලය ප්‍රඥප්තිය ඇතුළත් වෙන්න ඕනෑ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

නැහැ, ඒක අපේ කලින් එකේ තියෙනවා නේ?

**ගරු ඒ.එම්. යූසුප්**
Hon. A M Yoosuf

ධූර කාලය සඳහන් කරනවා නම් හොඳයි.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒක අපේ කලින් එකේ තිබෙනවා.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

සභා කාලය කියලා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

*IV වන උපලේඛනයේ 10 වන අංකය යටතේ සඳහන් "ගණපූරණය 1/2 ක් වත් විය යුතුය" යන්න "ගණපූරණය 1/2 ක් විය යුතුය" ලෙස සංශෝධනය කළ යුතු බව මම යෝජනා කරනවා.*

*IV වන උපලේඛනයේ අංක 12 යටතේ සඳහන් '12(1)' යන්න '10(2)' ලෙස සංශෝධන කළ යුතු බව මා යෝජනා කරනවා.*

*V වන උපලේඛනයේ අංක 5: ව්‍යුහය යන්නෙහි අංක 2 ඉවත් වී පහත සඳහන් පරිදි සංශෝධනය විය යුතුය.*

*2. දිස්ත්‍රික් තුනේ දිස්ත්‍රික් බල මණ්ඩල වල සභාපතිවරුන් සහ දිස්ත්‍රික් තුනේ බලමණ්ඩල වල සාමාජිකයන් අතරින් එක් දිස්ත්‍රික්කයට එක් අයකු බැගින් අමාත්‍යවරයා විසින් පත් කරන නියෝජිතයන් තිදෙනෙක්*

*V වන උපලේඛනයේ අංක 5: ව්‍යුහය යන්නෙහි අංක 3 වගන්තියට අමතරව පහත සඳහන් නව වගන්තිය ඇතුළත් වේ.*

*3. ......... / දිස්ත්‍රික් තුනට අදාළ වන පරිදි ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂකවරු තිදෙනෙකු*

*V වන උපලේඛනයේ අංක 5: ව්‍යුහය යන්නෙහි අංක 4 වගන්තිය ඉදිරියෙන් 'පළාත්' යන වචනය ඇතුළත් වේ.*

ඒ කියන්නේ අපේ මන්ත්‍රීතුමා කියපු ව්‍යුහය තමයි එතැන සංශෝධනය වෙන්නේ.

*V වන උපලේඛනයේ අංක 6: සාමාජිකත්වය යන්නේ, අංක 4 ඉවත් වී ඒ සඳහා "ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂවරු" යන්න ආදේශ කළ යුතු බව යෝජනා කරනවා.*

*V වන උපලේඛනයේ 08 වන වගන්තිය පහත පරිදි සංශෝධන විය යුතු බවට මම යෝජනා කරනවා.*

*"පළාත් බල මණ්ඩලය, දිස්ත්‍රික් බල මණ්ඩලවල සභාපතිවරු සහ ලේකම්වරු අතරින් දිස්ත්‍රික් තුන නියෝජනය වන පරිදි අදාළ විෂය භාර අමාත්‍යවරයා විසින් පත් කරන තිදෙනෙකුගෙන් සමන්විත වන්නේය. ඔවුන් අතරින් අමාත්‍යවරයා විසින් පත් කරන තැනැත්තෙකු පළාත් බලමණ්ඩලයේ සභාපති වන්නේය.*

*පළාත් බල මණ්ඩලයේ ලේකම්, සහකාර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයෙක් විය යුතුය"*

*V වන උපලේඛනයේ 10 (3) වගන්තිය පහත පරිදි වෙනස් කළ යුතුය.*

*"මෙම අරමුදල, ලංකා බැංකුව, මහජන බැංකුව හා ජාතික ඉතිරි කිරීමේ බැංකුව යන රාජ්‍ය බැංකුවක ඉතිරි කිරීමේ ගිණුමක හෝ ජංගම ගිණුමක තැන්පත් කළ යුතුය."*

*V වන උපලේඛනයේ 10 (4) වගන්තිය පහත පරිදි සංශෝධනය කළ යුතු බව යෝජනා කරනවා.*

*"මෙම මුදල් ආපසු ගැනීමේදී ග්‍රාම සංවර්ධන පළාත් අධ්‍යක්ෂ, සහ ලේකම් (ග්‍රාම සංවර්ධන සහකාර අධ්‍යක්ෂ) යන අය රජය වෙනුවෙන්ද, සභාපති හෝ ඔහු විසින් නම් කරනු ලැබූ පළාත් බල මණ්ඩල නියෝජිතයෙක්*

*පළාත් බල මණ්ඩලය වෙනුවෙන්ද අත්සන් කළ යුතුය."*

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

එතකොට ඒ පත් කරන පුද්ගලයා රජයේ නිලධාරියෙක්ද -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ කමිටුවේ බලධාරියා වෙන්නේ අපි පත් කරන අධ්‍යක්ෂවරයා. පළාත් බල මණ්ඩලයේ සහකාර සංවර්ධන අධ්‍යක්ෂවරයා. ඒ කියන්නේ අපේ Department එකේ.

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

සභාව විසින් -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දිස්ත්‍රික්ක තුනෙන් අපි තුන් දෙනෙක් පත් කරලා, ඒ බල මණ්ඩලය පිහිට වූවායින් පස්සේ ඒකේ ප්‍රධානියා වෙන්නේ අපේ පළාත් බල මණ්ඩලයේ සහකාර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂතුමා. නැත්නම් මේක දුවන්න බැහැ නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක පැහැදිලි නැහැ ගරු ඇමතිතුමා. මෙහෙමයි. ඇමැතිවරයා විසින් පත් කරනවා කියලා කිව්වාම, ඇමැතිවරයා පත් කරන්නේ කාවද කියන එක ඕකේ සඳහන් වුණා නම් හොඳයි නේද?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

නැහැ, ඒක මේකේ සඳහන් කරන්න අවශ්‍ය නැහැ. ඒක අපි කරන්නේ නියෝගවලින් නේ? ඒක කරන්න අපි නීති මාලාවක් හදනවා නේ? නීති මාලාව නොහොත් සුදුසුකම් ලත් කියන එක දානවා. මේ ප්‍රඥප්තියට එහෙම ඇතුල් කරන්න බැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ප්‍රඥප්තියකට ඇතුල් කරන්න පුළුවන් නේ? මෙන්න මේ ආකාරයේ රාජ්‍ය නිලධාරියෙක් -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

රාජ්‍ය නිලධාරියා තමයි අපේ සහකාර අධ්‍යක්ෂවරයා වෙන්නේ. පළාත් බල මණ්ඩලයේ ලේකම්, සහකාර ග්‍රාම සංවර්ධන අධ්‍යක්ෂවරයා විය යුතුය. එතකොට එයා තමයි Secretary.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

හරි. සභාපතිවරයා?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අර පත් කරන අයත් එක්ක නිල බලයෙන් පත් කරන්නේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒ කියන්නේ ඉන්න සාමාජිකයන්ගෙන් -

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

නැහැ මෙහෙම නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

පුරුදු කෙනෙක්ව පත් කර ගන්න පුළුවන් නේ?

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

මේවා පුරුදු කළේ එක්සත් ජාතික පක්ෂය නේ?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මම අහන ප්‍රශ්නයට උත්තර දෙන්න. වෙන එකක් නේ කියන්නේ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

නැහැ, මේ අහන්න කෝ? ඇත්තටම ගරු සභාපතිතුමනි, -

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඇමැතිතුමා මම අහන්නේ, ගෝල බාලයෙක් පත් කර ගන්න පුළුවන්ද කියලා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අද බලන්න ප්‍රවාහන අධිකාරිය අවුරුදු 20 ක් තිබුණු තත්ත්වය මොකක්ද?

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඕක නොවෙයි මම අහන්නේ. දැන් පිටනේ යන්නේ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අද බලන්න එහෙම පත් කළාම කොපමණ හොඳට දුවනවාද කියලා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක නොවෙයි මම අහන්නේ. ඇමැතිතුමා කියන්නේ ඕනෑම කෙනෙක් පත් කර ගන්න පුළුවන් කියලා නේ?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඕනෑම කෙනෙක් පත් කරන්න බැහැ. දිස්ත්‍රික් බල මණ්ඩලයෙන් තේරී එන අයට අමතර කෙනෙක් පත් කරනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

අපි අහන්නේ කොහෙන්ද කියලා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

එයා අපේ නියෝජිතයෙක් වෙනවා.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒක තමයි. නියෝජිතයෙක් හැටියට ගෝල බාලයෙක් වෙන්නත් පුළුවන් නේ?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔව්. ඒක ඉතින් කවුරු ආවත් එකයි. ඔබතුමාට කවදා හරි මෙතැනට ආවොත් ඔබතුමාටත් පුළුවන් ඒක කරන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා ඔබතුමා ඔය සංශෝධනයෙන් පිටපත් ගරු මන්ත්‍රීවරුන්ට ලබා දීලා තිබෙනවාද?

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

අපට පිටපත් ලැබිලා නැහැ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දැන් කාරක සභාවට සංශෝධනය එනවා නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා කාරක සභාව සංශෝධනය කරලා න්‍යාය පත්‍රය සමඟ ඉදිරිපත් කරලා තියෙන්නේ. ඔබතුමා තවදුරටත් මේක සංශෝධනය කරන්න ගියොත් මේකේ පොඩි ගැටළුවක් වෙනවා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, ඒ සංශෝධනයන්වලම සමහර තැන් නැවත සංශෝධනය කරන්න වෙනවා. ඒවා තමයි මේ ඉදිරිපත් කරන්නේ. සමහර ඒවා මුල් ප්‍රඥප්ති කෙටුම්පතේ උපලේඛනවලටයි අදාළ වන්නේ.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

දෙවන වර කියවීමේදී සංශෝධන ඉදිරිපත් කරන්න. සංශෝධනවලට යන්න පුළුවන්.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

අපට පිටපතක් නැහැ නේ?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් පිටපතක් නැහැ.

**ගරු මංජු ශ්‍රී අරංගල –** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මේ ඇමැතිතුමාට නිලධාරීන් වැරැදි උපදෙස් දීලා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මටත් පිටපතක් නැහැ. ඔබතුමා කියවනවා. මමත් බලාගෙන ඉන්නවා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

දැන් මේ සංශෝධනය –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා කියන එක මම දන්නෙත් නැහැ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒවා සංශෝධනය වෙන්න එපැයි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

වගන්තියෙන් වගන්තියට යන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**

Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඇමැතිතුමා ජනාධිපති උපදේශක හැටියටයි ප්‍රකාශ කරන්නේ. ඇමැතිවරයා හැටියට කරන ප්‍රකාශයක් නොවෙයි. එතුමා කියන දේ එතුමා දන්නෙත් නැහැ. එතුමා කියන දේ අපි දන්නෙත් නැහැ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඔබතුමාට වඩා ඔබතුමාගේ තාත්තා මම ගැන හොඳට දන්නවා.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු ඇමැතිතුමා සංශෝධන ටික කලින් දුන්නා නම් හොඳයි නේද? අපටත් පිටපත් බෙදුවා නම් හොඳයි නේද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කාරක සභාවේ සංශෝධන ටික ලැබිලා තිබෙනවා. ඒවාම නැවත සංශෝධනය කරන්නේ. සංශෝධනය විතරක් ඔබතුමා කියන්න. ඒ සම්බන්ධව විපක්ෂ නායකතුමාට කුමක් හෝ සංශෝධනයක් තිබෙනවාද?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ගරු සභාපතිතුමනි, මෙතැන ගරු ඇමැතිතුමා විසින් සභාවට සංශෝධන සියල්ල ඉදිරිපත් කරලා නැවත වරක් ප්‍රකාශ කිරීම සම්බන්ධයෙන් තමයි අපට පැහැදිලි කිරීම් කර ගන්න ඕනෑකමක් තිබුණේ. මේ ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සකස් කිරීමේදී ගරු ඇමැතිතුමා විශේෂයෙන්ම ගම්වල තිබෙන ග්‍රාම සංවර්ධන සමිතිවල ක්‍රියාකාරීත්වය පිළිබඳව, ඒවා යහපත් මගකට ගැනීම පිළිබඳව මම හිතන්නේ මීට වඩා පුළුල් සංවාදයකට ලක් කළ යුතු අවස්ථාවක් විධියට අද පත් වෙලා තිබෙනවා. සමහර ග්‍රාම සංවර්ධන සමිති පිහිටෙව්වාට පස්සේ මම පුද්ගලිකව දන්න විධියට අද සමහර ඒවා රැස් වෙන්නේම නැහැ. හේතුව මේ ග්‍රාම සංවර්ධන සමිතිවලට ග්‍රාමීය මට්ටමේ තිබෙන වැඩ කටයුතු කරන්න ලක්ෂ 5ක 7ක කොන්ත්‍රාත් කරන්න අවශ්‍ය අවසරය දීලා තිබෙන නිසාම ග්‍රාම සංවර්ධන සමිතිවල සභාපතිවරුන්ගේ ලේකම්ලාගේ සාක්කුවේ සීල් එක තිබෙනවා. ප්‍රාදේශීය ලේකම් කාර්යාලයට, ප්‍රාදේශීය සභාවට ගිහිල්ලා සීල් එක ගහලා කොන්ත්‍රාත් කරන සමිතියක් බවට අද පත් වෙලා තිබෙන්නේ. ග්‍රාමය සංවර්ධනය සඳහා නොවෙයි. තනිකරම කොන්ත්‍රාත් අරගෙන තමන්ට අවශ්‍ය දේ - මම දන්නේ නැහැ ගරු ඇමැතිතුමා මේ ප්‍රඥප්තියෙන්වත් යම් මග පෙන්වීමක් මේ සමිතිවලට කරලා තිබෙනවාද කියලා. ග්‍රාම සංවර්ධනයේ එකතු වන මුදල් විවිධ දේවල්වලට සමහර වෙලාවට සංගීත සංදර්ශවලට වියදම් කරනවා.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒක තමයි මම මේ කිව්වේ.

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක තමයි මම මේ කියන්නේ.

**ගරු උපාලි කොඩිකාර -** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒවා නොකරන්න තමයි ග්‍රාම සංවර්ධන -

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඒක තමයි ගරු ඇමැතිතුමනි, මුදල් එන්න ඕනෑ කියලා කිව්වේ. ඒක මේ ඉන්න නිලධාරීන් ග්‍රාම සංවර්ධන සමිතිවලින් හම්බ කරගෙන කන තැනට ගිහිල්ලා තිබෙනවා. ඒක වළක්වන්න, ඒකට නිර්ණායක ගෙන එන්නයි කියලා මේ කියන්නේ. මුදල් එන්න ඕනෑ.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

කොහොමද මුදල් එන්නේ?

**ගරු මංජු ශ්‍රී අරංගල -** විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

ඉතින් අර විධියට මුදල් එනවා. ඒ ග්‍රාම සංවර්ධන සමිතිය කොන්ත්‍රාත් එක කරනවා නම් කමක් නැහැ. ග්‍රාම සංවර්ධන සමිතියේත් උප කොන්ත්‍රාත් එකක් දෙනවා තව මිනිහෙකුට. ලක්ෂ දෙක තුනක් පාරේ බෝක්කුව හදන්න තිබෙනවා නම්, ග්‍රාම සංවර්ධන සමිතිය හැටියට මේසන්ලා ටිකක් අරගෙන මම හිතන්නේ ග්‍රාම සංවර්ධන සමිතියටත් වඩා හොඳට, වඩා වැඩි මුදලක් ඉතුරු කරගෙන හදන්න පුළුවන්. අද ග්‍රාම සංවර්ධන සමිති කරන්නෙත් ඒවායේ කොන්ත්‍රාත් එක අරගෙන තව උප කොන්ත්‍රාත්කරුවෙකුට දීලා 5% ක් සමිතියට තියා ගන්නවා. සමහර සමිතිවල නිලධාරීන්ට අදාළ කොන්ත්‍රාත්කරුවා හිතවත් නම් සමිතියට 5% හම්බ වෙන්නෙත් නැහැ. ඒ සියල්ල නිලධාරීන්ට හම්බ වෙන්නේ. ග්‍රාම සංවර්ධන සමිතිවල ඉන්න සභාපතිවරුන්ට, ලේකම්වරුන්ට, භාණ්ඩාගාරිකට හම්බ වෙන්නේ. මෙතුමා ගන්න උත්සාහය පිළිබඳව ගැටළුවක් නැහැ. අපි එතුමාට ස්තුතිවන්ත වෙනවා. අපි කියන්නේ, මේ එක්කම අදාළ ගමේ ග්‍රාම සංවර්ධන සමිති මීට වඩා යහපත් වූ විනිවිද පේන ස්වභාවයෙන් වැඩ කරලා වැඩ කටයුතු කරනවා නම් හොඳයි කියන එකයි. ග්‍රාම සංවර්ධන සමිතියෙන් කළ යුතු වැඩ නිර්ණායකයන් හැදෙන්න ඕනෑ. අද ග්‍රාම සංවර්ධන සමිතිවල මෙතුමා බැංකු ගිණුම් හදලා දාලා තිබෙනවා. අපි ඒ කටයුත්ත ගැන ස්තුතිවන්ත වෙනවා. නමුත් අද තිබෙන තත්ත්වය ඊට වඩා ශෝචනීයයි. ඒ නිසා ගමේ දියුණුවට වැඩ කරන ග්‍රාම සංවර්ධන සමිතිය කාගේ හරි මන්ත්‍රීවරයෙකුගෙන් ලැබෙන මුදලින් උප කොන්ත්‍රාත්කරුවෙකුට දීලා 5% ක් ගන්නවාට වැඩිය ග්‍රාම

සංවර්ධන සමිතියට හරි විධියට මේ බෝක්කුව හදන්න පුළුවන් නම් මේ ලක්ෂ හතර පහේ වැඩත් දෙනවා. ඒකයි ග්‍රාම සංවර්ධන සමිතිය කියන්නේ. ගමේ ඉන්න මේසන් වැඩකරුවෝ අල්ලාගෙන ඔවුන්ට ඒක දීලා, වැඩේ එක පැත්තකින් ක්‍රමවත්ව කෙරෙනවා. ග්‍රාම සංවර්ධන සමිතියට වඩා වැඩි ලාභයක් ලබන්න පුළුවන්. ඒ වැඩේ ඉතාම හොඳට කරගන්නත් පුළුවන්. ගමේ වැඩේ ගමේ සමිතිය කරන්නේ. අද කරන්නේ පිට කොන්ත්‍රාත්කාරයෙක් ඇවිල්ලා. මම කියන්නේ, මේ ගන්න උත්සාහය සාර්ථක වෙන්න මේ කාරණාව පිළිබඳවත් අපි අවබෝධයෙන් ගරු ඇමැතිතුමාට කටයුතු කරන්න කියන එකයි.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම මම සභාවේ සියලු දෙනාට ස්තූතිවන්ත වෙනවා. ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සංශෝධන සහිතව සභාගත කරලා අනුමත කර දීමට උත්සාහ ගැනීම සම්බන්ධව. මෙය අනුමත කරලා දෙන්න කියලා මම ඉල්ලනවා. අපේ ගරු විපක්ෂ නායකතුමා කිව්වා මේ ග්‍රාම සංවර්ධන සමිතිවල තිබෙන දූෂණය, වංචාව, අක්‍රියතාවය, ඒවා කරන ක්‍රියාවලිය සම්බන්ධව දැන් විපක්ෂ නායකතුමා කිව්වා. දැන් මේ ප්‍රඥප්තිය කියවලා බලනකොට –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

වඩා හොඳ අවබෝධයක් එයි. එහෙම වෙන්න –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා දැන් සාකච්ඡාව අවසන් වෙමින් යන්නේ. තවදුරටත් පැහැදිලි කිරීම් කරන්න අවශ්‍ය නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු මන්ත්‍රීතුමා පොඩ්ඩක් සමාවෙන්න. මට විනාඩි 05 ක් දෙන්න. ප්‍රඥප්තියේ කටයුතු අවසන් කරලා ඔබතුමාට අවස්ථාව දෙන්නම්. සංශෝධන සහිත ප්‍රඥප්ති කෙටුම්පත සම්බන්ධව සභාවේ එකඟත්වය?

**ගරු මන්ත්‍රීවරු**
Hon. Members

එකඟයි.

***ප්‍රශ්නය සංශෝධිතාකාරයෙන් විමසන ලදින්, සභා සම්මත විය.***
*Question, as amended was put and adopted*

***පූර්ණ කාරක සභාව නැවත පළාත් සභා තත්ත්වයට පත් කිරීම.***
*THE PROVINCIAL COUNCIL RESUMED.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මේ අවස්ථාවේ පූර්ණ කාරක සභාව පළාත් සභාවක් බවට පත් වෙනවා.

***ඊට අනුකූලව පූ.භා. 11.54 ට පූර්ණ කාරක සභාව පළාත් සභාව බවට පත් විය.***
*Accordingly at 11.54 a.m. the Provincial Council resolved it self into a committee of the whole Council.*
**[පූර්ණ කාරක සභාවේ ප්‍රගතිය]**
[Progress of the whole council]

ඒ අනුව බස්නාහිර පළාත් සභාවේ 2013 අංක ..... දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය සංශෝධිතාකාරයෙන් සභා සම්මත වූ ප්‍රඥප්තියක් බව මේ අවස්ථාවේදී ප්‍රකාශ කර සිටිනවා.

# ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය : තෙවන වර කියැවීම

RURAL DEVELOPMENT STATUTE : THIRD READING

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

*"බස්නාහිර පළාත් සභාවේ 2013 අංක ........ දරන ග්‍රාම සංවර්ධන ප්‍රඥප්තිය"*[2] තෙවන වර කියැවීම සඳහා සංශෝධිතාකාරයෙන් සභාවට ඉදිරිපත් කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමාට මේ පිළිබඳව ස්තුතියක් කිරීමට අවස්ථාවක් අවශ්‍යද?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

පොඩි අවස්ථාවක් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

කෙටියෙන් අවසන් කරන්න.

[2] අද දින වැඩ කටයුතු අවසානයේ පළ කර ඇත.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, විශේෂයෙන්ම විපක්ෂයේ සහ පාලක පක්ෂයේ සියලුම මන්ත්‍රීවරුන්ට අපේ ග්‍රාම සංවර්ධන දෙපාර්තමේන්තුව පිහිටුවීම සඳහා ප්‍රඥප්තිය සම්මත කර දීම සම්බන්ධව ස්තුතිවන්ත වෙනවා. අපේ විපක්ෂ නායකතුමාගේ කථාවේදී පැහැදිලි කරපු විධියට මේකේ අඩුපාඩු රාශියක් තිබෙන නිසා තමයි මම මේ දෙපාර්තමේන්තුව පිහිටුවන්නේ. මම හිතන්නේ, පළාත් සභා ඉතිහාසයේ පළමුවැනි වතාවට මෙවැනි බැංකුවක් පිහිටුවන්න මේ ප්‍රඥප්තියකට ඇතුල් කරලා යෝජනාවක් ඉදිරිපත් කරලා තිබෙන්නේ කියන එකත් මම සතුටින් ප්‍රකාශ කරනවා. අපේ ගමේ දුප්පත් මනුස්සයාව යම් තැනකට ගෙන එන්න පුළුවන් ශක්තිමත් ආයතනයක් බවට ග්‍රාම සංවර්ධන සමිතිය පිහිටුවන්න තමයි අපි මේ කටයුතු කරන්න හදන්නේ. රාජ්‍ය –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ගරු ඇමැතිතුමා, ඔබතුමා දීර්ඝ වශයෙන් කථා කරන්න අවශ්‍ය නැහැ.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

අවුරුදු 150 කට පෙර ඉඳලා මේ ග්‍රාම සංවර්ධන විෂයය තිබුණා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා නැවත කථා කරනවා. අවශ්‍ය නැහැ. ඔබතුමා මේ සම්බන්ධව මන්ත්‍රීවරුන්ට, නිලධාරී මහත්වරුන්ට ස්තුතියක් විතරක් කරන්න. ඊට එහාට යන්න එපා.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඇත්තටම මම ස්තුතිවන්ත වෙනවා. මම පොඩ්ඩක් මේ ගැන –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැවත කථා කරන්න අවශ්‍ය නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, 36 (1) යටතේ වරප්‍රසාද ප්‍රශ්නයක් තිබෙනවා. ගරු සභාපතිතුමනි, ගණපූරණය නොමැතිව මේ සභාව කල් තැබූ අවස්ථාවේ මේ සභාවේ දොරෙන් පිටතදී අපේ මහචාර්ය නිමල් ලාන්සා ගරු ඇමැතිතුමාගේ කථා විලාශය – මේ මහචාර්යකම දෙන්නේ කථා විලාශයට. කථා විලාශය පිළිබඳව. ගරු සභාපතිතුමනි, තමුසේ, ඕයි කියලා තමයි –

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මහචාර්ය කියලා එහෙම කියන්න අවශ්‍ය නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, තමුසේ, ඕයි කියන්න එතුමාට මහචාර්යකමක් තිබෙනවා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඔබතුමා වරප්‍රසාද ප්‍රශ්නය කියන්න කෝ?

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ගරු සභාපතිතුමනි, නිමල් ලාන්සා ගරු ඇමැතිතුමා දැන් සභාවේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ඒකට මට කරන්න දෙයක් නැහැ. එහෙම නම් සභාවේ ඇවිල්ලා ඉන්න කියන්න.

**ගරු උපාලි කොඩිකාර –** අමාත්‍යතුමා
Hon. Upali Kodikara - Minister

ඒ සම්බන්ධව විවේචනයක් කරන්න –

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

මට කරන්න දෙයක් නැහැ. මම එතුමා එනකල් බලාගෙන ඉන්නද?

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

විවේචනය කිරීමක් නොවෙයි. ඔබතුමාගේ වරප්‍රසාද ප්‍රශ්නය ඉදිරිපත් කරන්න කෝ?

**ගරු නෙ ක් මල්ලව**
Hon. Neluk Mallawa

සභාවේ වුණු දෙයක් නොවෙයි.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

සභාවේ මේ දොර ඉස්සරාහිදි වුණේ. ඒ වාගේම ගරු සභාපතිතුමනි, මම එතැන දොර ළඟ ඉදිද්දී ඔබතුමාට කථා කරපු විධියත් මට ඇහුනා. අර කාමරේ ඉඳගෙන. ඒ නිසා කරුණාකරලා එතුමාට උගන්වන්න කොහොමද අනෙක් සහෝදර මන්ත්‍රීවරුන්ට සහ සභාපතිතුමාට කථා කරන්නේ කියලා. විශේෂයෙන්ම සභාපතිතුමාට කථා කරන විධිය එතුමාට උගන්වන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට ගැටළුවක් වුණේ නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

තමන්ගේ පක්ෂයේ සභාපතිතුමා. සභාපතිතුමාටත් එහෙම කථා කළා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

නැහැ, නැහැ.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

කථා කරපු විධිය අපට එළියට ඇහුනා.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

ඒක මට අදාළ නැහැ. ඔබතුමා වාඩි වෙන්න.

**ගරු ශ්‍රීනාත් පෙරේරා**
Hon. Srinath Perera

ගරු සභාපතිතුමනි, ඒක අනවශ්‍ය වුණාට එළියේ ඉන්නවා පොලීසියේ නිලධාරී මහත්වරු. අනෙකුත් නිලධාරී මහත්වරු ඉන්නවා. ඒ සියලුදෙනාටම කථා කරන විධිය ඇහෙනවා. ඒක නිසා ගරු සභාපතිතුමනි, එතුමාටත් කථා කරලා Workshop එකක් දැම්මොත් හොඳයි. මොකද, කථා කරන විධිය. තමුසේ ඕයි භාෂාව අඩුම ගාණේ වැල්ලවීදියේ ජනතාවවත් කථා කරන්නේ නැහැ. අද වැල්ලවීදියේ ඉන්නෙත් හොඳට ඉගෙන ගත්තු ජනතාවක්. ඒක නිසා සහෝදර මන්ත්‍රීවරුන්ට කථා කරන විධිය, ඒ වාගේම සභාපතිතුමාට කථා කරන විධිය එතුමාට පොඩ්ඩක් කියලා දෙන්න වෙයි. නැත්නම් ඔබතුමා අවවාදයක්වත් දෙන්න.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මට එහෙම ගැටළුවක් වුණේ නැහැ. ඊළඟට න්‍යාය පත්‍රයේ පෞද්ගලික මන්ත්‍රී යෝජනාව යටතේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අවස්ථාව.

## පෞද්ගලික මන්ත්‍රී යෝජනා
PRIVATE MEMBERS MOTION:

## පොදු පහසුකම් රථ ගාල් මගින් ජනතාවගෙන් මුදල් අය කිරීම අහෝසි කිරීම

CANCELLATION OF CHARGING MONEY FROM THE PUBLIC BY COMMON FACILITIES VEHICLE PARKS

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, *"බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශයේ ඉදි කර ඇති සියලුම කඩ සාප්පු සංකීර්ණ, රෝහල් ඇතුළු විවිධ ගොඩනැගිලි හිමියන් විසින් එම ගොඩනැගිලි සැලසුම් අනුමත කර ගැනීමේදී දෙනු ලබන පොදු පහසුකම් හා රථගාල් භාවිතා කරමින් පාරිභෝගිකයන්ගෙන් මුදල් අය කරනු ලැබේ. මෙම රථ ගාල් එම ගොඩනැගිලි සඳහා අනුමැතිය දීමේදී නාගරික සංවර්ධන අධිකාරියේ රෙගුලාසි හා පළාත් පාලන ආයතනවල නීතිරීතිවලට අනුව නියම කරවන අතර, එම පහසුකම් විකිණීම නීති විරෝධී කටයුත්තකි.*

*එම නිසා, මෙම පොදු පහසුකම් පෞද්ගලික රථ ගාල් ලෙස ජනතාවගෙන් මුදල් ලබා ගැනීම අහෝසි කරවන ලෙසත්, ඉදිරියට එවැනි ආයතනවලට එරෙහිව නඩු පැවරීමට අදාළ පළාත් පාලන ආයතනවලට බලය ලබා දෙන ලෙසත් මෙම බස්නාහිර පළාතේ පළාත් සභාව යෝජනා කරයි."*

***ප්‍රශ්නය සභාභිමුඛ කරන ලදී.***
*Question proposed*

**ගරු යූ. ජෝර්ජ් පෙරේරා** - විපක්ෂයේ ප්‍රධාන සංවිධායක
Hon. U. George Perera - Chief Opposition Whip

***[විසින් ස්ථිර කරන ලදී.]***
*[Seconded]*

[ අ.භා. 12.19 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

ගරු සභාපතිතුමනි, මම මේ යෝජනාව ගෙන එන්න මූලික පදනම වෙන්නේ විශේෂයෙන්ම බස්නාහිර පළාතේ රෝහල්වලට විතරක් හැදිලා තිබෙන විශේෂ රෝගයක් නිසා. බස්නාහිර පළාත් සභා බල ප්‍රදේශය තුළ විශේෂයෙන්ම සාප්පු සංකීර්ණ, පෞද්ගලික රෝහල්, තරු පහේ හෝටල් සහ තවත් සුපිරි වෙළඳ සංකීර්ණ ඉතා විශාල ප්‍රමාණයක් මේ වනකොට ඉදි කරලා තිබෙනවා සහ ඉදි වෙමින් පවතිනවා. ගරු සභාපතිතුමනි, අදාළ පළාත් පාලන ආයතනයට ගොඩනැගිලි අනුමැතියක් ගන්න ගියාම අදාළ සැලසුමේ බොහොම පැහැදිලිව ලියන්න ඕනෑ Proposed Building for What කියන එක. කුමන ව්‍යාපාරයක් සඳහාද මෙවැනි ගොඩනැගිල්ලක් අනුමත කරන්නේ කියන එක. එතකොට ඒකේ තිබෙනවා රෝහලක් නම් අනුමත කරන්නේ, යෝජිත ගොඩනැගිල්ල රෝහලක් සඳහා වූ යෝජිත ගොඩනැගිල්ල කියලා. එතකොට නාගරික සංවර්ධන අධිකාරියත්, අදාළ පළාත් පාලන ආයතනයත් - මේකේ තිබෙනවා අදාළ ගොඩනැගිලි සැලැස්මේ කාමර කීයක් තිබෙනවාද?

Channel Service මොනවාද? මේ රෝහලේ තිබෙන පහසුකම් මොනවාද? මේ රෝහලට එන රෝගීන් ප්‍රමාණය කීයද? එහෙම නැත්නම් වෙනත් වෙළඳ සංකීර්ණයක් ගත්තොත් සාප්පු කොපමණ තිබෙනවාද? කොපමණ ප්‍රමාණයක් එන්න තිබෙනවාද? ඒ අනුව අදාළ ව්‍යාපාර ස්වභාවය අනුව නාගරික සංවර්ධන අධිකාරියත්, අදාළ පළාත් පාලන ආයතනයත් එකතු වෙලා තීන්දු කරනවා ඒ ගොඩනැගිල්ලට තිබිය යුතු වාහන ප්‍රමාණයට අවශ්‍ය රථගාල් ප්‍රමාණය කොපමණද කියලා. ඒ වාගේම වැසිකිළි වාගේ පොදු පහසුකම්, Common Utility Facilities කියලා තමයි නාගරික සංවර්ධන අධිකාරී පනතේ බොහොම පැහැදිලිව සඳහන් වෙන්නේ. මෙම පහසුකම් ලබා දෙන්නේ ගරු සභාපතිතුමනි, අදාළ ගොඩනැගිල්ල ඇතුළට එන එකී ගොඩනැගිලි ව්‍යාපාර ස්වභාවයේ පහසුකම් භුක්ති විඳීම සඳහා එන අයවයි.

උදාහරණයක් විධියට ගත්තොත් කිසියම් පෞද්ගලික රෝහලකට පුද්ගලයෙක් වාහනයක් අරගෙන ඇතුල් වෙන්නේ, [ ගරු නිරෝෂන් පාදුක්ක ]

ඒ රෝහලේ ඉන්න රෝගීයෙක් බැලීමට හෝ රෝගියෙක් ඇතුළත් කිරීමේ මූලික කාරණය පදනම් කරගෙන. නමුත් ඒ අදාළ රෝහල ඇතුළට ඇවිල්ලා අපි දැකලා තිබෙනවා. සමහර රෝහල් ගැන මම කනගාටුවෙන් කියනවා ගරු සභාපතිතුමනි. කොළඹ පෞද්ගලික රෝහලක් තමන්ගේ රථගාල අතුරු බදු දීලා තිබෙනවා. එක්තරා පෞද්ගලික රෝහලක් තමන්ගේ රථගාල අතුරු බදු දීලා ආදායම් හොයනවා. මගේ මිත්‍රයෙක් මට මේ කියපු කථාවක්. ඔහුගේ බිරිඳටත්, ඔහුටත් වාහන දෙකක් තිබෙනවා. දරුවා ඩෙංගු රෝගයෙන් පෙළෙද්දී එක්තරා පෞද්ගලික රෝහලකට ඇතුළත් කරලා. ඇතුළත් කරද්දී ගිහිල්ලා තිබෙන්නේ නෝනා මහත්මියගේ වාහනයෙන්. එතකොට ටිකට් එකක් දුන්නාලු රෝහලේ කාමරයකට ඇතුළත් වුණු රෝගියෙක් නිසා ටිකට් පත රථගාලට දෙන්න කියලා. ඊට පස්සේ ඒ දවස ඇතුළත හතර පාරක් තමන්ගේ දරුවා බලන්න දරුවාගේ පියා රෝහලට ඇවිල්ලා තිබෙනවා. රථගාලෙන් ඔහුගෙන් රුපියල් 600/- ක මුදලක් එක දවසට අය කරලා තිබෙනවා. නමුත් ඒ රෝහලට Channel Service එකට ගියාම ගරු සභාපතිතුමනි, ටිකට් පතේ බොහොම පැහැදිලිව රෝහල් ගාස්තු කියලා ඒක වෙනම මුදලකුත් අය කරනවා. නමුත් දොස්තර මහත්මයා එන්න පැයක් පරක්කු වුණොත්, නොම්මරේ ගන්න පැයක් හිටියොත් රථගාලෙන් එළියට එනකොට ඔහුගෙන් රථගාල් ගාස්තු කියලා වෙනම ගන්නවා. ඒ වාගේම අද කොළඹ එක්තරා රෝහලක් තමන්ගේ පොදු පහසුකම් රථගාලේ තවත් ගොඩනැගිල්ලක් හදලා. හැබැයි, නාගරික සංවර්ධන අධිකාරිය ඊට එහා පැත්තේ ඉඩමක් දීලා තිබෙනවා තාවකාලික රථගාල් පහසුකම් සඳහා. ඒක වෙනම ප්‍රශ්නයක්.

ගරු සභාපතිතුමනි, කොළඹ තිබෙනවා, තවත් එක්තරා සුපිරි වෙළඳ සංකීර්ණ දෙකක්. වැසිකිළියට ගිහිල්ලා එළියට එනකල් බලාගෙන ඉන්නවා රුපියල් 10 ක් ගන්න. ඒ ගොඩනැගිල්ල ඇතුළට ඇවිල්ලා, ඒ ගොඩනැගිල්ල ඇතුළේ තිබෙන ව්‍යාපාරවලින් බඩු මිලදී ගන්න එන ජනතාවගෙන්ම මෙලෙස මුදල් අය කරනවා. ඒත් එක්කම තව කොළඹ වෙළඳ සංකීර්ණයක් තිබෙනවා. සමහර ආයතන කියනවා අපේ රථගාලේ දාලා වෙන වැඩවලට යනවා කියලා. ඒකට විකල්පය ඒ ආයතන හොයා ගන්න ඕනෑ. එක්තරා පෞද්ගලික වෙළඳ සංකීර්ණයක් තිබෙනවා බඩු අරගෙන රිසිට් පත දුන්නාම රථගාලෙන් එළියට වාහනය අරගෙන යන්න දෙනවා. සල්ලි ගන්නේ නැහැ. වාහනේ ඇවිල්ලා දානවා. බඩු අරගෙන යනකොට රිසිට් එක ගේට්ටුවට පෙන්නුවාම යන්න දෙනවා. තමන් තමන්ට ආවේණික විධියට හදා ගන්න. ඒ ගොඩනැගිල්ලට එන පොදු අය. ගරු සභාපතිතුමනි, මම මේ කියන්නේ Public Car Park නොවෙයි. මම කියන්නේ මේ අදාළ ගොඩනැගිල්ල ඇතුළත. කවුරුවත් රෝහලක් ඇතුළට යන්නේ නැහැ බඩු මිලදී ගන්න. අදාළ ගොඩනැගිල්ල අනුමැතිය දී නාගරික සංවර්ධන අධිකාරිය සහ අදාළ පළාත් පාලන ආයතනයේදී - හැබැයි නාගරික සංවර්ධන අධිකාරියේ ඉන්න Director වරු සියලු දෙනාටම කථා කළා. ඔවුන් සියලු දෙනාම පිළිගත්තා. ගාස්තු අය කරන්න පුළුවන්ද බැරිද කියන එක මේකේ සඳහන් වීමක් නැහැ. ඔවුන් කීවේ එය පළාත් පාලන විෂයයට අදාළ කාරණයක්. අපි බලන්නේ, ඒ අදාළ ගොඩනැගිල්ලේ දිග පළල අනුව, උස පළල අනුව ඒකට අදාළ ව්‍යාපාර ස්වභාවය අනුව තමයි අපි රථවාහන ප්‍රමාණය තීරණය කරලා තිබෙන්නේ. ඊට පස්සේ ඉතිරි කටයුතු භාර වෙන්නේ පළාත් පාලන ආයතනයට කියලයි කිව්වේ.

එහෙම නම් ගරු සභාපතිතුමනි, දැන් කොළඹ තරු පහේ හෝටල් තිබෙනවා. ඒ කවුරුවත් තමන්ගේ රථ ගාලෙන් ටිකට් ගන්නේ නැහැ. මිනිස්සු විවාහ උත්සවලට යනවා. වෙනම කාමර පහසුකම් තිබෙනවා. හැබැයි සල්ලි ගන්නේ නැහැ. පෞද්ගලික රෝහලකට ගියාම තමයි මේ රෝගය තිබෙන්නේ. රථගාලෙන් අය කිරීම. ඒ වාගේම කොළඹ එක්තරා සුපිරි වෙළඳ සංකීර්ණ තුනක් මේ වැඩේ කරනවා. ඉතාමත්ම අනවශ්‍ය බර පැනක් මේවාට යන ජනතාවට දරන්න වෙන්නේ. මම දන්නවා මේ සියලුම ගොඩනැගිලි සියයට සියයක්ම සමහරු ඉදි කරලා තිබෙන්නේ රජයේ භූමි තුළ. අනූනව අවුරුදු බදු. එහෙම නැත්නම් තිස් අවුරුදු බදු. එහෙමත් නැත්නම් මේ සියලු දෙනාම අපේ ලංකාවේ BOI ව්‍යාපෘතියක් විධියට අනුමත කරගෙන බදු සහන සහ භාණ්ඩ අපනයනය කිරීම සඳහා විශාල සහන ලබාගෙන තිබෙනවා. ඉතින් මෙවැනි ආයතන දිගින් දිගටම ජනතාවගෙන් මුදල් අය කරනවා. තවත් දවසක් එක්තරා විශේෂඥ වෛද්‍යවරයෙක් හම්බ වෙන්න ගිහිල්ලා තිබෙන්නේ, ඔහු පිළියන්දල ඉඳලා වෑන් එකක් කුළියට අරගෙන. තමන්ගේ අම්මාව අරගෙන. බොහොම අමාරුවෙන් Hospital එක ඇතුළට ගියාම ඩොක්ටර් එන්න පැයක් යනවා කිව්වාලු. ඔහුට වෙලාව දීලා තියෙන්නේ 05.00 ට. දොස්තර මහත්මයා ඇවිල්ලා තිබෙන්නේ 06.30 ට. මොහුව බලලා තිබෙන්නේ 07.45 ට. එළියට එනකොට

රථ ගාලට පැය තුනකට සල්ලි ගත්තා. ඉතින් මෙවැනි තත්ත්වයක් තිබෙනවා. එතකොට පළාත් පාලන ආයතනයකට - අපි ටිකට් එකක් කඩනවා නගර සභා Public Car Park කියලා දාලා ජනතාවට වාහනය Park කරලා ඕනෑම දිහාක යන්න. ඒ ගැන කිසි ගැටළුවක් නැහැ. නමුත් මේ ආයතනය තුළට යන්නේ ගරු සභාපතිතුමනි, අනුමත කරපු අදාළ විෂයය සඳහායි. රෝහලක් ඇතුළට යන්නේ, ඒ රෝහලෙන් අත්‍යවශ්‍ය සේවාවක් ලබා ගන්න. නැත්නම් රෝගියෙක් බලන්න. රෝහල්වලට තමයි විශේෂයෙන්ම මේ රෝගය තිබෙන්නේ. ඒ වාගේම විවිධ ආකාරයෙන් පැමිණිලි ලැබිලා තිබෙනවා. ඒ නිසා ඒ ඔක්කෝම ඉවසන්න පුළුවන්. අවසානයේ ටිකට් එකත් ගත්තාට පස්සේ ගහලා තිබෙනවා රථ ගාලේ වාහනය තිබිලා යම්කිසි ප්‍රශ්නයක් වුණොත් අපි වග කියන්නෙත් නැහැ කියලා. හැබැයි හැප්පිලා ගියොත්, රිවස් කරලා හප්පලා තිබුණොත්, කවුරු හරි වාහනේ ගාගෙන ගියොත් ඒකටත් අපි වග කියන්නේ නැහැ කියලා. ඉතින් මේ සියලු කාරණා ගත්තාම මම හිතන්නේ පළාත් පාලන ආයතනවලට වගකීමක් තිබෙනවා, අදාළ ගොඩනැගිලිවල පොදු පහසුකම්වලින් ජනතාවට බරක් වන එක නිදහස් කරලා දෙන්න. සියලු පළාත් පාලන ආයතන බස්නාහිර පළාතේ ප්‍රධාන අමාත්‍යවරයා යටතේ තිබෙන නිසා මම විශේෂයෙන්ම ඉල්ලා සිටිනවා මේ පිළිබඳව සභාවේ මතවාදය, මන්ත්‍රීවරුන්ගේ අදහස් අහලා මේ යෝජනාව සභා සම්මත කරගෙන අදාළ පළාත් පාලන ආයතනවලට, පළාත් පාලන කොමසාරිස්තුමිය හරහා චක්‍රලේඛයක් නිකුත් කරලා මෙවැනි ගොඩනැගිලිවල පොදු පහසුකම්, විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරියේ අධ්‍යක්ෂක මහත්වරු කිව්වා මේ බලය තිබෙන්නේ පළාත් පාලන ආයතනවලට කියලා. ඒ නිසා මේ සඳහා ඔවුන්ව සාකච්ඡාවකට ගෙනැල්ලා, එහෙම නැත්නම් මොකක්ද කළ යුතු දේ කියලා තීරණයක් අරගෙන ජනතාවට ලැබී තිබෙන ඒ පොදු පහසුකම්, විශේෂයෙන්ම ගොඩනැගිල්ලක් තුළ ලබා දීලා තිබෙන පොදු පහසුකම් - දැන් හරියට මේක check කළොත් එහෙම පොදු පහසුකම් ඇතුළත කැන්ටිනුත් දාලා තිබෙනවා. පොදු පහසුකම් කලාපය තුළ, රථ ගාල ඇතුළත කැන්ටින් දාපු ස්ථානත් තිබෙනවා. ඒවාත් කුලියට අතුරු බදු දීලා තිබෙනවා. ඉතින් මේ සියලු කාරණා අරගෙන බස්නාහිර පළාත් සභාව විධියට මේ ප්‍රදේශයේ ජනතාවට දැවෙන ප්‍රශ්නයක් මේක. ඒ නිසා ප්‍රසන්න රණතුංග ගරු ප්‍රධාන ඇමැතිතුමා විදේශ ගතව හිටියත් එතුමාටත් මේ යෝජනාව පිළිබඳව කරුණු සැල කරලා, මේ පිළිබඳව මන්ත්‍රීවරුන්ගේ අදහසුත් අරගෙන අපි උත්සාහ කරලා බලමු මොකක්ද බස්නාහිර පළාත් සභාව විධියට මේ ආයතනවලට යන අහිංසක රෝගීන් - හැම රෝහලකටම ගිය පුද්ගලයෙක් එළියට එන්නේ සමහර අය තමන්ගේ දේපළ විකුණගෙන. සමහර අයට මිනිය ගන්න විධියක් නැහැ. සම්පූර්ණ බිල ගෙවනකල් බලහත්කාරයෙන් ඒ රෝහලේ බොඩිය තියාගෙන ඉන්නවා. ගෙදර මනුස්සයෙක් ඇපකාරයෙක් විධියට තියා ගන්නවා. එහෙම කරන අය අහිංසක මනුස්සයෙක් කුළියට ගේන වාහනයෙනුත් ගාස්තු අය කරනවා ගරු සභාපතිතුමනි. ඒ පිළිබඳව අවධානය යොමු කරන්න කියලා ඉල්ලමින් මම මේ යෝජනා සභාවට ඉදිරිපත් කරනවා.

[ අ.භා. 12.33 ]

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

ගරු සභාපතිතුමනි, මම හිතන්නේ ඉතාම එලවත් යෝජනාවක් නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ගෙනැල්ලා තිබෙන්නේ. ඒකට මටත් කාලය ලබා දීම පිළිබඳව මම හුඟක් ස්තුතිවන්ත වෙනවා. මොකද, අපි කවුරුත් වාහනවල යන එන අය. මේ ප්‍රශ්නය සැබවින්ම ඇත්ත කියන එක අපට පේන්න තිබෙනවා. අපි ඕනෑම වෙලාවක යම් සැලැස්මක් අනුමත කරනවා නම්, ප්‍රාදේශීය සභාවල සභාපතිවරු හැටියට වැඩ කරපු අපි දන්නවා, ඒකට අපි කොන්දේසි මාලාවක් දානවා. ඒකේ එක කොන්දේසියක් තමයි රථ වාහන නැවැත්වීමට ඉඩ තිබිය යුතුයි යන්න. එතකොට මේ හැම ව්‍යාපාරයකටම ඒ වෙනුවෙන් අවස්ථාව සලසා දීලා තමයි මේ සැලසුම් අනුමත කරලා තිබෙන්නේ. නමුත් අපි පාරිභෝගිකයෝ. ඒ ආයතනවලට ගියාම අපේ සැප පහසුවත් විකුණනවා කියලා තමයි අපට කියන්න තිබෙන්නේ. අපි වෙනත් කරුණක් නිසා පරක්කු වුණත්, අර කිව්වා වගේ වෛද්‍යවරයාගේ පැමිණීම ප්‍රමාද වුණත්, පහසුකම් ගන්න ගිහිල්ලා ඒ පහසුකම් දීම ඒ ආයතනයෙන් පරක්කු වුණත් ඒකට දඩ ගෙවන්නේ අපි. එහෙම නැත්නම් මහජනතාව. එතකොට අපි ගෙවනවාට වඩා ලොකු මුදලක් සමහර වෙලාවට මේ කටයුත්ත සඳහා යනවා. ඒ නිසා එන අය යම් අසහනයක් මේකෙන් භුක්ති විඳිනවා. ඒකට හේතුව. සමහර වෙලාවට Private ඉස්පිරිතාලෙකට ගියත්, ඒ අය ලොකු සල්ලිකාරයෝ නොවෙයි. නමුත් ඉක්මණින් වැඩ කරගන්න, වඩා විශ්වාසයකින් වැඩ කරගන්න වාගේ දේවල් හිතලා ඒ වාගේ පුද්ගලික රෝහල්වලට යනවා. ඒ වාගේ වෙලාවක මේ වාගේ අමතර ගාස්තු ලබා දෙන්න සිද්ධ වුණාම ඒ අය තවත් ආර්ථික වශයෙන් ගැටළු සහගත තත්ත්වයන්වලට මුහුණ දෙනවා. ඒක නිසා අපි ඒ ආයතන සම්බන්ධයෙන් ඍජුවම තීන්දුවක් ගන්න ඕනෑ. මහජනයා වෙනුවෙන් පහසුකම් ගන්න මේ වාගේ Plan එකක් අනුමත කරනකොට යම් ඉඩකඩක් සලසා තිබෙනවා නම් ඒ ඉඩකඩ ශතයකටවත් විකුණන්න බැහැ. ඒ ආයතනයෙන් බෙහෙත් ගන්න හරි, වෙනත් කටයුත්තකට හරි ආපු අයට ඒ මුදල නොගෙන නොමිලේ ඒ අවස්ථාව, ඒ පහසුකම ලබා දෙන්න ඕනෑ. ඒ වාගේම තමයි සුපිරි වෙළඳ සංකීර්ණවලට ගියාම පාරිභෝගිකයාට අවශ්‍ය බඩු භාණ්ඩ එක පාර අරගෙන එන්න බැහැ. විශේෂයෙන්ම කාන්තාවන් ගියාම හැම තැනම ඇවිදලා තමන්ට අවශ්‍ය බඩු ලාබෙට ගන්න උත්සාහ කරනවා. එතකොට වැඩි කාලයක් පරක්කු වෙනවා. ඒ වෙලාවට ඒ ඇඳුම් පැළඳුම්වලට නැත්නම් ඒ අවශ්‍යතාවලට වියදම් කළා වාගේ ප්‍රමාණයක් මේ කටයුතු සඳහාත් වියදම් කරන්න ගියාම පාරිභෝගියා ඉතාම අපහසුතාවලට පත් වෙනවා. ඒක නිසා මේ පොදු පහසුකම් කීයටවත් මිල කරන්න එම ආයතනවලටත්,

නැත්නම් ඒ ආයතනවලට හිතවත් පිරිසටවත් ඉඩ දෙන්න එපා කියන නීතියක් මම හිතන්නේ ගෙන එන්න ඕනෑ. ඒක ඉතාමත් වටිනවා.

ඒ වාගේම තමයි අපි ප්‍රාදේශීය සභාවල, නගර සභාවල සැලසුම් අනුමත කරනකොට බලන්න ඕනෑ නීති රීති ගොඩක් තිබෙනවා. සමහර වෙලාවට අද මේ හැම එකක්ම ඒ අනුවම කෙරෙන්නේ නැහැ. එක එක්කෙනාගේ හිතවත්කමට සමහර විට, ඒ පහසුකම් අඩුවෙන් මේවා අනුමත කරලා දෙනවා. ඒකෙනුත් සාමාන්‍ය ජන ජීවිතයට තමයි හිරිහැර වෙන්නේ. අද තාප්පයක් ගහන්න ඕනෑ නම් අපි දන්නවා කවදා හරි ඉදිරියේදී මේ පාරවල් පළල් වෙනවා. එහෙම නැත්නම් ඉදිරියේ එන පහසුකම්වලට තව ඉඩ ප්‍රමාණයක් යනවා. එහෙම බලලා මේවාට ඉඩ නොදෙන නිසා - ඒ වාගේම කනගාටුවෙන් වුණත් කියන්න ඕනෑ, සමහර වෙලාවට නිලධාරීන්ගේ හෝ ඉන්න කෙනෙකුගේ අත මිට මොලොවපුවාම අර නීති මුකුත් නැතිව අනුමත කරලා දෙනවා. අපට පාරක් පළල් කරගන්න ගියත් මේ වාගේ ගැටළු හුඟක් ඉහළින් බලපානවා. මොකද, තාප්ප විතරක් නොවෙයි. අපට ගෙවලුත් කඩන්න වෙන අවස්ථා තිබෙනවා. මම හිතන්නේ නැවත වරක් මේවා පිළිබඳව

[ ගරු අශෝකා ලංකාතිලක ]

ලොකු සැලකිල්ලක්, විමසීමක් කරන්නට කාලය ඇවිල්ලා කියලා. අද රටේ ඉදිරි සංවර්ධන කටයුතු කරන්න යනකොට - පාරක් හදනවා නම් පාර හදන්න, පාර පළල් කරන්න විතරක් නොවෙයි. ඒවාට මිල ගෙවන්න අසාධාරණ විධියට මුදල් සොයන්න සිද්ධ වෙලා තිබෙනවා. ඒකෙන් සංවර්ධනය පස්සට යනවා. ඒ වාගේ දේවල් පිළිබඳව හිත යොමු කරන්න ඕනෑ. මොකද මම මේ ටිකත් මේ අවස්ථාවේ කියන්නේ ඒ ප්‍රාදේශීය සභාවල්, නගර සභාවල් මේ ගැන හොයන්නේ නැති නිසා. මේ ගැන නියමාකාරයෙන් ක්‍රියා කරන්නේ නැති නිසා තමයි නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ ප්‍රශ්නවලට මුහුණ පාන්න සිද්ධ වෙලා තිබෙන්නේ. අද පළාත් පාලනයේ නීතිරීති බොහෝ අය ගණන් ගන්නේ නැහැ. සල්ලි තියෙන අය සල්ලි වියදම් කරලා කර ගන්න උත්සාහ කරනවා. අනෙක් අය තිබෙන නීතිය ගණන් ගන්නේ නැතුව කරන්න උත්සාහ කරනවා. ඒ නිසා මම පොදුවේ සියලු ප්‍රාදේශීය සභා, පළාත් පාලන ආයතන වෙනුවෙන් නැවත වරක් සාකච්ඡාවක් ආරම්භ කරන එක හොඳයි කියලා හිතනවා. මොකද, අද මේ මහ වැහි කාලයක්. මේ වැහි කාලයේදී අපි යට වෙන්නේ ගංගා පිටාර ගලලා නොවෙයි. අපි යට වෙන්නේ වැහි වතුරට. බොහෝ දුරට වැහි වතුරට යට වෙන්නේ මේ තාප්ප සංස්කෘතිය නිසා තමයි. ඒ තාප්ප හැදුවා වුණත් ඒවායෙන් වතුර ගලා යන්න පුළුවන් විධියට - මම මාතෘකාවෙන් පිට කථා කරනවා වෙන්න පුළුවන්.

නමුත් මම කියන්නේ පළාත් පාලන ආයතන මේවා ගැන උනන්දු නොවන නිසා, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ තවත් බොහෝ ප්‍රශ්න මතු වෙලා තිබෙනවා. මම හිතන්නේ, වර්තමානයේදී ලොකු විවාදයක් අවශ්‍යයි. මේ පහසුකම් විකුණනවා වාගේම නාගරික සංවර්ධන අධිකාරිය යටතේ තියෙන නීති රීති නොසලකා හැරීම නිසා මහජනයා පොදුවේ මුහුණ දෙන ප්‍රශ්න පිළිබඳව විමසා බැලීමක් අවශ්‍යයි. එහෙම කළා නම්, මේ හැම එකකටම පිළියම් යොදන්නට අපට පුළුවන් වෙනවා. ඒකෙන් අපතේ යන විශාල මුදල් සම්භාරයක් ඉතුරු කරන්න පුළුවන් වෙනවා. ඒ නිසා පළාත් පාලනයේ නැවත සංවාදයක් ඇති වෙන්න ඕනෑ. පළාත් පාලන නීති රීති, ඒ වාගේම නාගරික සංවර්ධන අධිකාරියෙන් කෙරෙන නීති රීති, ඉඩම් ගොඩකිරීමේ හා සංවර්ධනය කිරීමේ සංස්ථාවෙන් කෙරෙන නීති රීති, තවත් කොතෙක් දුරට මේ රටේ ක්‍රමාණුකූලව කෙරෙනවාද නැද්ද කියන එක පිළිබඳව සොයා බැලීමක් අවශ්‍යයි. ඒකෙන් තමයි ඩෙංගු උවදුරේ ඉඳලා බොහෝ උවදුරු අපේ රටට ගලා ගෙන එන්නේ. මේ පළාත් පාලන ආයතනවල තියෙන නීති රීති පළාත් පාලන ආයතන ක්‍රියාත්මක කරන්නේ නැහැ. නිලධාරි ඒවා කරන්න උත්සාහයක් කරන්නේ නැහැ. කිසිම මිත්‍රකමක් නොසලකා, ඥාතිත්වයක් නොසලකා හරියට කරනවා නම් අපට තියෙන ප්‍රශ්න ගොඩකින් ගොඩ එන්නට පුළුවන්කම තියෙනවා. අද ස්වභාව ධර්මයෙන් හරි මේ වාගේ ප්‍රශ්නවලට අපි මුහුණ දීලා තියෙන්නේ ඒකයි. ඇත්ත වශයෙන්ම මම ආරක්ෂක අමාත්‍යාංශයේ ලේකම්වරයාට ස්තුතිවන්ත වෙනවා. අද තාප්ප සංස්කෘතිය මේ සමාජයෙන් අරන් දාන්න ගොඩක් වැඩ කෙරෙනවා. මොකද, මේ ස්වභාවික වතුර ගලා ගෙන ගියාම මම හිතන්නේ, එක තැනක රොක් වෙලා සමාජයට හිරිහැර වන බොහෝ දේවල් සිද්ධ වන්නේ නැහැ. අද පාරවල් වාරිමාර්ග වෙලා. පෞද්ගලිකව ඒ ගොඩ කරන ඉඩම් ඉස්සිලා ප්‍රශ්න ගොඩකට මුහුණ දෙනවා. ඒ නිසා පළාත් පාලන නීති රීති පිළිබඳ, නැවතත් ඒවා හරියට කරවා ගන්න මේ වාගේ පහසුකම් නීත්‍යානුකූලව වෙන් කරලා තියෙන්නේ, මහජනයාගේ පහසුව සඳහා. ඒ සියල්ල හරියට කරවන්න පළාත් පාලනය පිළිබඳ ලොකු සංවාදයක් ගොඩ නැඟිය යුතුයි කියලා කියමින් මම නිරෝෂන් පාදුක්ක මැතිතුමාට නැවතත් ස්තුතිවන්ත වෙමින්, ඒ වාගේ මහජනයාගේ පහසුවට වෙන් කරලා තියෙන බිම් යොදා ගනිමින් මුදල් අය කිරීම සම්පූර්ණයෙන් වළක්වන ලෙස ඉල්ලා සිටිමින් මගේ වචන ස්වල්පය මෙයින් අවසන් කරනවා. ස්තුතියි.

**ගරු සභාපතිතුමා**
Mr. Chairman

මෙම අවස්ථාවේදී අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනයේ අසුන් ගන්නවා ඇති.

***ඊට අනුකූලව ගරු සභාපතිතුමා [සුනිල් විජේ රත්න මහතා] මූලාසනයෙන් ඉවත් වූයෙන් අශෝකා ලංකාතිලක ගරු මන්ත්‍රීතුමිය මූලාසනාරූඪ විය.***

*Accordingly the Hon. Chairman [Mr. Sunil Wijeratne] left the Chair and Hon. Asoka Lankathilaka M.P.C took the Chair*

**ගරු අශෝකා ලංකාතිලක**
Hon. Asoka Lankathilaka

මීළඟට මුජිබර් රහුමාන් ගරු මන්ත්‍රීතුමා. ඔබතුමාට විනාඩි හතරයි.

[ අ.භා. 12.37 ]

**ගරු මොහොමඩ් මුජිබුර් රහුමාන්**
Hon. Mohamed Mujibur Rahuman

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාගේ මෙම යෝජනාව ඇත්තටම ඉතාමත් කාලෝචිත, අවශ්‍ය යෝජනාවක් හැටියට තමයි මා දකින්නේ. මොකද, අද කොළඹ ප්‍රදේශයේ විශේෂයෙන්ම වාණිජ නගරවල අද තියෙන විශාල ගොඩනැගිලි හා වෙළඳ ආයතන ජනතාවගේ මුදල් ඉතාමත් අනියම් ආකාරයෙන් මංකොල්ලකෑමක් හැටියට තමයි මම නම් දකින්නේ, මේ සිදුවීම. මොකද, නාගරික සංවර්ධන අධිකාරිය හා ඒ ප්‍රදේශවල තියෙන පළාත් පාලන ආයතනවල රෙගුලාසි - අනුව විශාල වශයෙන්ම මේ නගරවල තියෙන වෙළඳ ආයතන. ඒ වාගේම වෙළඳ ගොඩනැගිලි ඒවා බැංකු කටයුතු වෙන්න පුළුවන්. සුපර් මාර්කට් වෙන්න පුළුවන්. රෝහල් වෙන්න පුළුවන්. ඒ සියලුම දේවල් හදන්න කලින් යම් යම් ගොඩනැගිලිවලට අනුව නිර්ණායක තියෙනවා. ඒ අනුව තමයි ඒවාට අනුමැතිය ලැබෙන්නේ. ඒ ගොඩනැගිලි හදන කොට ඒ ගොඩනැගිලිවල අයිතිකරුවන් ඒ නාගරික සංවර්ධන අධිකාරියට හා ඒ පළාතේ පළාත් පාලන ආයතනවලට ඉදිරිපත් කරලා තමන්ට අවශ්‍ය අනුමැතිය ලබා ගත්තාට පස්සේ අද ඔවුන් ඒවා අනියම් ආකාරයෙන් ජනතාව මත පටවන ස්වරූපයක් තියෙනවා. එක පැත්තකින් මුදල් ගසා කෑමකුත් ඒ හරහා සිදු වෙනවා. මම දකින දේ තමයි මේ හරහා විශේෂයෙන්ම අද ඕනෑම ගොඩනැගිල්ලක් වෙළඳ ව්‍යාපාර කටයුතු සඳහා හදන කොට අනිවාර්යයෙන්ම රථ ගාලක් පෙන්විය යුතුයි. එහෙම පෙන්වන්නේ නැත්නම් ඒකට අනුමැතිය ලැබෙන්නේ නැහැ. විශේෂයෙන්ම නාගරික සංවර්ධන අධිකාරියෙන් ඒ අනුමැතිය ලබා දෙන්නේ නැහැ. විශේෂයෙන්ම වෙළඳ ආයතන හා වෙළඳාම මුල් කර ගෙන හදන ඕනෑම ගොඩනැගිල්ලකට ඒ අනුමැතිය ලැබෙන්නේ නැහැ. නමුත් අනිවාර්යයෙන්ම අපි දන්නවා. ඒ එක එක ගොඩනැගිලිවල වර්ග ප්‍රමාණය අනුව ඒ තියෙන පර්චස් ප්‍රමාණය අනුව තමන්ට ගාල් කරන්න අවශ්‍ය වාහන ප්‍රමාණය සඳහා ඉඩකඩ ඒ ගොඩනැගිල්ල තුළ තිබිය යුතුයි. නමුත් ඒවා පෙන්නලා ඒ අනුමැතිය අරගෙන තමයි මීට පස්සේ මේවාට මුදල් අය කරන්නේ. විශේෂයෙන්ම මේ රට තුළ නොයෙකුත් ආයතන තියෙනවා. රෝහල් තියෙනවා. ඒ වාගේම සුපර් මාර්කට් තියෙනවා. ඒ වාගේම නොයෙකුත් වෙළඳ බැංකු ආයතන තියෙනවා. එහෙම ගත්තාම මේ හැම ගොඩනැගිල්ලකටම රජයේ අනුමැතිය අර ගෙන තියෙන්නේ, රථගාලත් එක්ක. නමුත් ඊට පස්සේ ඔවුන් කරන දේ තමයි ඒවාට එන ගණුදෙණුකරුවන්ගෙන් ඔවුන්ගේ වාහන නැවැත්වීම සඳහා ගාස්තුවක් අය කිරීමයි. අපි විශේෂයෙන්ම සුපර් මාර්කට් එකක් වාගේ ගත්තාම අද හැම නගරයේකම පාහේ සුපිරි සුපර් මාර්කට් තියෙනවා. නමුත් ඒවා වල තමන්ගේ වාහනය නවත්වලා බඩු භාණ්ඩ ගන්න ගියාම අපෙන් වාහන ගාස්තුවක් හා වාහන නවතා තැබීමේ ගාස්තුවක් අය කරන්නේ නැහැ. ඒ වාගේම අපි බැංකුවකට ගණුදෙණු කරන්න ගියාමත් අපේ වාහනය නවත්වලා ගිහිල්ලා බැංකුවේ ගණුදෙණු කරලා එන විට වාහන ගාස්තුවක් අපෙන් අය කරන්නේ නැහැ. ඒ වාගේ ආයතන තියෙනවා. ගොඩනැගිලි තියෙනවා. නමුත් රෝහල් සම්බන්ධව ගත්තාම ඉතාමත් කනගාටුදායක තත්ත්වයක් තියෙන්නේ. විශේෂයෙන් පෞද්ගලික රෝහල් පිළිබඳව ගත්තාම. ඒ රෝහල් ඉතාමත් අධික ගාස්තු ජනතාවගෙන් අය කරන ගමන්ම, තමන්ගේ ඒ රෝගියා එන වාහනයෙනුත් මුදල් හම්බ කරන්න, රෝහල් අද පෙළඹිලා තියෙනවා. පෞද්ගලික රෝහල්. මෙය පාලනයක් නැති තත්ත්වයට කඩා ගෙන වැටිලා තියෙනවා. මම හිතන්නේ මේ ගැන වගකිව යුතු ආයතන, නාගරික සංවර්ධන අධිකාරිය, ඒ පළාත් පාලන ආයතන මේවා ගැන සොයා බැලිය යුතුයි. මේ හරහා අනියම් ආකාරයෙන් ජනතාවගේ මුදල් මංකොල්ලකෑමක් තමයි මේ සිද්ධ වෙන්නේ

අපි දන්නවා. තවත් කාරණයක් තමයි, විශේෂයෙන්ම රෝහල්වල තියෙන චැනල් සේවය. සමහර දොස්තරවරු ඒ චැනල් සේවය හරහා තමන්ගේ රෝගියා චැනල් කරන්න සමහර වෙලාවට රෝහල්වලට එන්නේ රාත්‍රී කාලයේ. රෑ එකොළහට, දොළහට එන දොස්තරවරුත් ඉන්නවා. ඒ දොස්තර මහත්තයා රෑ දොළහට ආවත් අපට දෙන්නේ පහට වෙලාව. අපි පහේ ඉඳන් රෑ දොළහ වෙන කල් ඉස්පිරිතාලේ ඉඳලා දොස්තර මහත්තයාට පෙන්වලා එළියට ආවාට පස්සේ ඒ දොස්තර මහත්තයා පරක්කු වෙන වෙලාවටත් වාහන ගාස්තුව ගෙවන්න ඕනෑ ඒ රෝගියාමයි. එහෙම නැත්නම් ඒ පාරිභෝගිකයා තමයි ඒ වාහන ගාස්තු ගෙවන්නත් ඕනෑ. එය ඉතාමත්ම අසාධාරණයි. දොස්තර මහත්තයා ඉස්පිරිතාලෙට එන්නේ පරක්කු වෙලා. ඒ දොස්තර මහත්තයා පරක්කු වෙලා එන වෙලාවටත් සල්ලි අය කරන්නේ රෝගියාගෙන්. ඉතින් මම හිතන්නේ, මේක ඉතාම අසාධාරණ මංකොල්ලකෑමක් හැටියට තමයි මම නම් දකින්නේ. ඒ නිසා මේකට අනිවාර්යයෙන්ම අලුත් නීති ගෙන ආ යුතුයි. පළාත් සභා මට්ටමේ, විශේෂයෙන්ම පළාත් පාලන ආයතන මට්ටමේ. ජනතාවගෙන් අනියම් ආකාරයෙන් මේ කරන ගසා කෑම නවත්වන්න මේ බස්නාහිර පළාත් සභාව හැටියට මේ පිළිබඳව විධිමත් නීති හා ක්‍රියාදාමයන් යටතේ කටයුතු කළ යුතුයි කියමින් ඒ වාගේම මේ යෝජනාව ගෙනාපු නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙමින් මගේ වචන ස්වල්පය අවසන් කරනවා. ස්තුතියි.

[ අ.භා. 12.47 ]

**ගරු ගුණසිරි ජයනාත්**
Hon. Gunasiri Jayanath

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඉතාමත්ම වැදගත්, මේ සභාවට අදාළ යෝජනාවක් ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් මම එතුමාට

ස්තුතිවන්ත වෙනවා. සැබැවින්ම බස්නාහිර පළාත් සභාවට ක්‍රියාත්මක කළ හැකි යෝජනාවක්. බොහෝ විට අපේ පළාත් සභාවට ඉදිරිපත් වන යෝජනා පළාත් සභාවේ බල සීමාව තුළ නැති, එක්කෝ අපි ඇමරිකාවට ගහන්න කථා කරන යෝජනා තමයි බොහෝ විට ඉදිරිපත් වන්නේ. එහෙම ගත්තාම මේ යෝජනාව අපේ සභාවට ක්‍රියාත්මක කරන්න පුළුවන් යෝජනාවක්. ඒ වාගේම තමයි මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මම කනගාටු වෙනවා මේ යෝජනාව එන්න මත්තෙන් සාකච්ඡා කරපු ග්‍රාම සංවර්ධන සංශෝධන පනත සාකච්ඡාවේමේදී ඉතාම අඩු මන්ත්‍රී සංඛ්‍යාවක් මේ සභාවේ රැඳී සිටීම පිළිබඳව. අපි එක පැත්තකින් චෝදනා කරනවා, පළාත් සභාවට තියෙන බලතල නැති කරනවා කියලා. හැබැයි 13 වැනි ආණ්ඩුක්‍රම ව්‍යවස්ථා සංශෝධනයේ පළාත් සභාවට සම්පූර්ණයෙන් අයිති වුණු විෂය, ග්‍රාම සංවර්ධන විෂය. ඒ අපට අයිති වුණු විෂය ඊට අදාළ පනතේ සංශෝධනයක් සාකච්ඡා වෙන වෙලාවේත් මේ සභාවේ අඩු මන්ත්‍රී සංඛ්‍යාවක් සිටීම සම්බන්ධයෙන් සැබැවින්ම කනගාටු වෙනවා. ඒ කොහොම වුණත් අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ඉදිරිපත් කරපු යෝජනාව ඇත්තෙන්ම යථාර්ථවාදී යෝජනාවක්. පැහැදිලිවම මේ යෝජනාවේ සඳහන් කරුණු සත්‍ය කරුණු. විශේෂයෙන් පළාත් පාලන ආයතනයක හිටපු සභාපතිවරයෙක් හැටියට මම දන්නවා. අපි ඒ ගොඩනැගිලි සැලසුම් අනුමත කරන්නේ, ඒ ගොඩනැගිල්ලේ තියෙන සේවාවන් පිළිබඳව

[ ගරු ගුණසිරි ජයනාත් ]

සලකලා. ඒ ගොඩනැගිල්ලේ පරිමාණය පිළිබඳව සලකලා. ඊට අවශ්‍ය රථවාහන නතර කිරීමේ ස්ථාන අනිවාර්යයෙන් ඒ ගොඩනැගිලි හිමිකරුවා සැපයිය යුතුයි. අද මෙතැන සාකච්ඡා වුණු ආකාරයට, කරුණු සඳහන් වුණු ආකාරයට කොළඹ නගරයේ පමණක් නොවෙයි. අපි ජීවත් වන ගම්පහ දිස්ත්‍රික්කයේත් මේ වාගේ වාහන නැවතුම් ස්ථාන - පොදු වාහන නැවතුම් ස්ථාන නොවෙයි. ව්‍යාපාරික කටයුත්තට අදාළ. අපි පෞද්ගලික ඉස්පිරිතාලෙකට ගියා නම්, රෙදි සාප්පුවකට ගියා නම් ඒ රෙදි සාප්පුවට අදාළ වාහන නවත්වන ස්ථානය ගම්පහ දිස්ත්‍රික්කයේත් අය කරන ස්ථාන අනන්ත තියෙනවා. සමහර විට කොළඹ තදබදය වැඩි නිසා, ඉඩම් අඩු නිසා එහෙම වෙනවාය කියලා අපට හිත හදා ගන්නවත් පුළුවන්. නමුත් ගම්පහ දිස්ත්‍රික්කය වාගේ දුර තැන්වලත් මේ තත්ත්වය අද සුළුවෙන් හෝ දකින්න පුළුවන් කාරණයක්. ඒ නිසා මම ඉස්සෙල්ලා කියපු විධියට සැබැවින්ම පළාත් සභාව යටතේ තිබෙන පළාත් පාලන ආයතන සැලැස්ම සඳහා අනුමැතිය දෙන නීතිමය අයිතියක් තියෙන ආයතන හැටියට මේ තත්ත්වය වළක්වන්න අපි වහ වහා මැදිහත් වන්න අවශ්‍යයි. අපේ රටේ දැන් පොඩි ස්වභාවයක් ඇති වෙලා තියෙනවා අද ආරක්ෂක ලේකම්, නාගරික සංවර්ධන අමාත්‍යාංශයේ ලේකම්තුමා ගෙන යන වැඩ පිළිවෙළ පිළිබඳව ජනතාව යම් විධියක හොඳ පැත්තක් දකිනවා. එතුමා යම් වැඩකට, කාර්යයකට අත ගැහුවා නම්, ඒකේ අවසානයක් දක්වා සාර්ථක කරනවා. ඒ නිසා අපට බලයක් තියෙන විෂයක් තුළ තියෙන කාරණාව එතුමා වෙත යන්නට ඉඩ තියන්න එපයි කියන ගෞරවණීය ඉල්ලීම මේ බස්නාහිර පළාත් සභාවෙන් කරනවා.

අපේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කරපු යෝජනාව සැබවින්ම අපට ක්‍රියාත්මක කරන්න පුළුවන් යෝජනාවක්. පළාත් සභාව යටතේ තියෙන පළාත් පාලන ආයතන අපේ හරහා ක්‍රියාත්මක වන්නේ. ඒ පළාත් පාලන ආයතනවලින් තමයි ගොඩනැගිලි සැලසුම්වලට අනුමැතිය දෙන්නේ. ඒ අනුමැතිය දෙද්දී කොහේවත් කියලා නැහැ, ඒ අදාළ ගොඩනැගිල්ලට ලබා දෙන රථවාහන ගාල් කිරීමට අය කරන්න පුළුවන් කියලා. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා මේ ගැන නාගරික සංවර්ධන අධිකාරියෙන් ඇහුවාම අය කරන්න පුළුවන් හෝ බැහැයි හෝ කියන කිසිම සඳහනක් එහිදී කියැවුණේ නැහැයි කියලා. නමුත් අපට තියෙන දැනුම තමයි ඒ ව්‍යාපාරික කටයුත්ත මගින් ඒ ආයතනයෙන් සේවාවක් ගන්න තියෙනවා නම් අය කරන්න බැහැ. ඒ ගන්න කාරණයට ඒ ව්‍යාපාරික සේවාව ලබා ගන්න පුද්ගලයා භාණ්ඩයක් මිල දී ගැනීමෙන් හෝ වෙනත් සේවාවක් ලබා ගැනීමෙන් හෝ ඊට අවශ්‍ය මුදල් ගෙවනවා. ගෙවන නිසා වාහනය නවතා තැබීමට ගාස්තුවක් අය කරන්න බැහැ. ඒකේ අනෙක් වැදගත් කාරණය තමයි නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා, ඒ ලබා දෙන ටිකට් පතේ පැහැදිලිව සඳහන් කරලා තියෙනවා, වාහනයේ ආරක්ෂාව සම්බන්ධයෙන් වග කියන්නේ නැහැයි කියලා. දෙයියනේ වග කියන්නේ නැත්නම් වාහනය නවතා තැබුවාට පමණක් ඇයි අපි ගෙවන්නේ? ඔහුගේ ආයතනයෙන් භාණ්ඩයක් මිල දී ගැනීම හෝ සේවාවක් ලබා ගැනීම වෙනුවෙන් අපි මුදලක් ගෙවනවා. අපි පෞද්ගලික රෝහලකට ගියොත් කොළඹ තියෙන ප්‍රධානම රෝහල් තමයි නවලෝක, ඩර්ඩන්ස්, සෙන්ට්‍රල් මේ පෞද්ගලික රෝහල් තුනේම අති විශාල ලෙස මේ මුදල් අය කිරීම කරනවා. එතුමා කිව්වා. නේවාසික රෝගියෙක් හිටියොත් එක අවසර පත්‍රයයි දෙන්නේ. සමහර විට අර කිව්වා විධියට වාහන දෙක තුනකින් ආවොත් ඒවාට ගෙවන්න ඕනෑ. ඒ වාගේ තමයි වෛද්‍යවරයෙක් චැනල් කරන්න ගියාම වෛද්‍යවරයා එනවයි කියපු වෙලාවට එන්නේ නැතුව වැඩි කාලයක් ගත්තොත් ඒවාට අපි ගෙවන්න ඕනෑ. හදිසිම අවශ්‍යතාවයක් සඳහා වෛද්‍යවරයෙක් චැනල් කරන්න හයට හතට ගියාම වෛද්‍යවරයා දොළහට එකට හම්බ වෙන වෙලාවල් තියෙනවා. මම එහෙම අත්දැකීම්වලට මුහුණ දීලා තියෙනවා. ඒ සියලු කාලවේලාවල්වලට අපි මුදල් ගෙවන්න ඕනෑ. ඒ නිසා මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ පළාත් සභාවේ විෂයට අයිති අපේ යටතේ පාලනය වන පළාත් පාලන ආයතන හරහා අනුමැතිය දීපු මේ ගොඩනැගිලි සැලසුම්වල ඒ වාහන රථ ගාල් සඳහා අයකිරීම අපේ බල අධිකාරිය තුළ අපට නවත්වන්න පුළුවන් කාරණයක්. ඒ නිසා අපි මේ සභාවේ ඉදිරිපත් කරලා තියෙන බොහෝ යෝජනා පිළිබඳව පසු විපරම් කළොත් බොහෝ විට ඒවා ක්‍රියාත්මක වෙලා නැහැ. මම ඉස්සෙල්ලා කිව්වා වාගේ අපේ ආරක්ෂක ලේකම්තුමාට මේ කාරණය යන්න තියන්නේ නැතුව අපේ රටේ ජනතාව වෙනුවෙන් අපේ පළාත් සභාව තුළ මේ තියෙන අසාධාරණය වහා නවත්වන්න අවශ්‍යයි.

උදාහරණයක් කිව්වොත් - මුලින් කිව්වා රෝහලකට ඇතුළත් වුණාම අති විශාල මුදලක් ගෙවන්න ඕනෑ. මම බොහොම වගකීමෙන් කියනවා. නවලෝක රෝහලේ සිද්ධියක් සිදු වුණා. එම්. ආර්.අයි. ස්කෑන් එකක් කර ගන්න ගිය අපේ බියගම ප්‍රදේශයේ දරුවෙකුට ජීවිතයෙන් වන්දි ගෙවන්න සිද්ධ වුණා, ඒ එම්.ආර්.අයි. එක පුපුරලා. නමුත් ඒ මැරුණු දරුවාව ඒ අයිතිකරුවන්ට දෙන්නේ නැතුව දවස් ගණනාවක් තියා ගෙන ඉඳලා විශාල බිලක් හදලා ඒ මුදල් අය කරලා තමයි මිනිය දුන්නේ. එහෙම පෞද්ගලික රෝහල් සේවාවක් තියෙන රටක් මේක. ඒ නිසා මේ වාගේ අසාධාරණකම්වලට අපිට තවත් ඉඩ දෙන්න බැහැ. ඒ නිසා මේ පළාත් සභාවට අයිති, පළාත් සභාවේ නීතියට අයිතිව තියෙන විෂයයක් යටතේ ක්‍රියාත්මක වෙන කාරණයක් මේක. ඒ නිසා අපේ බලය යොදලා - පළාත් සභාවේ බලය කියන්නේ නීතිය. නීතිය අනුව මේ අදාළ ආයතනවල වාහන නැවතීමේ ගාස්තු අය කිරීම සම්පූර්ණයෙන් නවත්වන්න, මේ පළාත් කටයුතු කරන්න ඕනෑ.

ඒ වාගේම තමයි මට දැනගන්න ලැබුණා, පිළියන්දල නගරයේ එක ව්‍යාපාරයක ගොඩනැගිල්ලක වාහන නැවතුම් සඳහා අනුමැතිය දීපු ස්ථානයේ දැන් කඩ දාලා තියෙනවා කියලා. පිළියන්දල නගරයේ එක ගොඩනැගිල්ලක. කැස්බෑවේ එක ගොඩනැගිල්ලක වාහන නැවතීම් අනුමැතිය දීපු ගොඩනැගිලි සැලැස්මේ දැන් Parking නොවෙයි තියෙන්නේ. දැන් ඒකෙත් කඩ දාලා. එහෙම තැනුත් අපේ පළාත තුළ තියෙනවා. ඒක ගැනත් හොයලා අවශ්‍ය ක්‍රියාමාර්ග ගන්න කියන කාරණය මතක් කරමින් ගරු මන්ත්‍රීතුමාට මේ යෝජනාව ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.51 ]

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, මේ අවස්ථාවේදී මේ යෝජනාව මේ ගරු සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධයෙන් නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට මම අතිශයින්ම ස්තුතිවන්ත වෙනවා. ඉතා වැදගත් කාලෝචිත යෝජනාවක් හැටියට මේ යෝජනාව අපි දකිනවා. මොකද හේතුව? ඇත්ත වශයෙන්ම අද රක්ෂණ සහතිකයක් සහිතව බලපත්‍රයක් සහිතව මිලදී ගත් වාහනයක් කෙනෙක් මහාමාර්ගයට ඇතුල් කරලා, ඒ මාර්ගයේ ධාවනය කරන වාහනය තමන්ට කොතැනක හරි නතර කළොත් ඒ නතර කිරීම වෙනුවෙන් යම් මුදලක් ගෙවන්න සුදුසු පරිසරයක් තමයි දැන් ඉදිවෙමින් පවතින්නේ. මෙවැනි දේ සිදු වුණාට වැරැද්දක් නැහැ. නමුත් මෙයට ක්‍රමානුකූල විධිමත් භාවයක් තියෙන්න ඕනෑ. සමහරක් වෙලාවට අපේ නගරයේ තියෙන වැසිකිළියකට ගියොත් යම් මුදලක් ගන්නවා. මෙය නීත්‍යානුකූලව කරනවාද? එහෙම නැත්නම් පුද්ගලයෙක් එතැන පිරිසිදු කරමින් ඒ මුදලක් ගන්නවාද කියන කාරණාව අපට තිබෙනවා. සමහර විට අපි කියනවා, මුදලක් ගත්තත් කමක් නැහැ. ඉතාමත් පිරිසිදු ස්ථානයකට යන්න අවස්ථාවක් ලැබුණයි කියලා. එහෙම ස්ථාන තිබෙනවා. නමුත් අඩු ගණනේ රෝහලකට ගියාම රෝහලට ඇතුල් වෙන පුද්ගලයාගේ වාහනය ඇතුලට ගත්තාට පස්සේ ගතවන පළමුවැනි විනාඩි තිහ හරි සානුකම්පිතව සලකා බලලා සමහර වෙලාවට අපි දවස පුරාම වාහනය නතර කර ගෙන හිටියොත් එහෙම අනෙක් අයට, ඊළඟ කණ්ඩායමට තියෙන පහසුකම් අඩු වෙලා, මේ රථගාල තුළ අවශ්‍ය ප්‍රමාණයට පහසුකම් සපයා ගන්න බැරි වෙනවා. මෙවැනි බාධකත් තියෙනවා. එවැනි කාරණා නිසා සමහර විට මෙය පාලනය කළ යුතු අවස්ථාත් තියෙනවා. නමුත් දැන් මෙය පාලනය කිරීම සඳහා නොවෙයි කරන්නේ. මෙය කරන්නේ තනිකර ව්‍යාපාරයක්. මේක දැන් ව්‍යාපාරික මට්ටමට ගොඩනැගුනු නිසා තමයි මේ නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා කිව්වා එතුමාගේ එක මිත්‍රයෙකුට එක දවසකට රුපියල් අටසියයක් විතර Parking වලට ගෙවන්න වුණා කියලා, එක රෝහලක් තුළ. මේක අතිශයින්ම අසාධාරණයි. මෙවැනි තත්ත්වයක් ක්‍රියාත්මක වීම තුළ සිදුවන්නේ, අනිවාර්යයෙන්ම එන තමන්ගේ පාරිභෝගිකයාව සූරාගෙන කෑමයි. මෙය නතර කිරීම සඳහා විධිමත් ක්‍රියාමාර්ගයක් අත්‍යවශ්‍ය වෙනවා. ඇත්තටම පළාත් පාලන ආයතනවලට මේ ගොඩනැගිලි අයදුම්පත්‍රවලට මේ සැලැස්මට අනුමැතිය දෙන කොටම ගිවිසුම්ගත වෙන්න පුළුවන්, මේක පාවිච්චි කරන්න පුළුවන් මේ විධියටයි කියලා. දැන් උදේ ඉඳලා හවස් වන තුරු එක රෝගියෙක් බලන්න සමහරක් වෙලාවට දහ පහළොස් දෙනෙක් එන්න පුළුවන්. ඒ දහ පහළොස් දෙනාම ඒ රෝගියා බලන්න ඒම වෙනුවෙන් තමන්ගේ වාහනය නතර කළාට රුපියල් දහස් ගණනක් ගෙවනවා. මේක තමයි දැන් සිදුවෙමින් පවතින කාරණාව. ඒ එක්කම දැන් මේ රෝහලට ඇතුල්වන රෝගියාගෙන් බිල්පත්වලින් විවිධ මට්ටමේ අය කිරීම් කරනවා. ඒගොල්ලෝ විශාල ලාභයක් උපදනවා. ඒ උපදන අතර තමයි මෙවැනි මුදල් අයකිරීමකුත් සිද්ධ වන්නේ. අවශ්‍යතාවයක් මත නිතර නිතර එළියට යන්න වුණොත් එළියට ගිහිල්ලා එන හැම වාරයකම ගෙවන්න ඕනෑ. දහ පාරක් එළියට ගියා නම් දහවතාවක් ගෙවන්න ඕනෑ විධියට තමයි මේ ක්‍රියාවලිය සිද්ධ වන්නේ. අපි විශ්වාස කරන විධියට අපේ අයත් වාහනයක් යම් රථගාලකට ඇතුල් කළාට පස්සේ තමන්ගේ කාර්ය භාරය ඉක්මණින් ඉවර කර ගෙන එළියට එනවා මිසක් ඒ ඇතුළේ රැඳී සිටියොත්, සමහර වෙලාවට රෝගියෙක් ගාව නැවතිලා ඉන්න - කාමර සියයක් තියෙන රෝහලක ඇතුළට එන හැම කෙනෙක්ම වාහනයකින් ඇවිල්ලා, වාහනය රථ ගාලේ නතර කරලා දවසක් තියන්න ගත්තොත් අර ආයතනයට මෙය පාලනය කර ගන්න විධියක් නැහැ. ඒ නිසා විධිමත් ක්‍රියාමාර්ගයක් සංවිධානය වෙන්න ඕනෑ. නමුත් මේ සූරා කෑම ක්‍රියාත්මක වෙන තත්ත්වය වෙනස් කරන්න ඕනෑ. මා විශ්වාස කරන විධියට ඒ කටයුත්ත සිද්ධ වෙන්න ඕනෑ. මහා මාර්ගයේ හෝ එහෙමත් නැත්නම් වෙනත් ආයතනයකට මේ මුදල් අය කිරීම සම්බන්ධයෙන් - මේක සේවාවක් සැපයීම මිස මුදල් එකතු කිරීමේ අපේක්ෂාවක් මෙතැන තියෙන්න බැහැ. ඒ සේවා සැපයීමේදී

සේවාවන් පාලනය කර ගැනීම සඳහා යම් යම් විධිවිධාන යෙදීම ඒ ආයතනය සතු විය යුතු වරප්‍රසාදයක් ලෙස මම දකිනවා. ඒ නිසා මම විශේෂයෙන්ම ගරු මන්ත්‍රීතුමාට ස්තුතිවන්ත වෙනවා. මේ තත්ත්වයේ වෙනසක් ඇති කරන්න. පාරිභෝගිකයන්ට හිරිහැරයක් නොවන ආකාරයට මේ තත්ත්වයන් පාලනය කරන්න. පළාත් පාලන ආයතනවලට ඇති හැකියාව පිළිබඳව ඒ අයගේ අවධානය ලක් කරලා, මේ තත්ත්වයන් වෙනස් කරන්න ක්‍රියාමාර්ගයක් ගැනීම තමයි සුදුසු වන්නේ. හැම නගරයකම නගර සභාව, එහෙම නැත්නම් ප්‍රාදේශීය සභාව, එහෙම නැත්නම් මහ නගර සභාව මාර්ගය දෙපස නතර කරලා තිබුණත් ඒ අය Parking places කියලා හඳුන්වා දීලා යම් ස්ථානවලින් මෙවැනි මුදල් අය කිරීමක් කරනවා. එසේ සිදු වෙනවා. හැබැයි ගරු මන්ත්‍රීතුමා කිව්වා වාගේ මුදලකුත් අරගෙන, වාහනය පිළිබඳ වගකීමෙනුත් නිදහස් වන එක තමයි වැරැද්ද. දැන් -

**ගරු ඒ.එම්. යූසුෆ්**
Hon. A M Yoosuf

ටිකට් එකක් දෙනවා අර විධියට ලියලා.

**ගරු ජගත් අංගගේ** - අමාත්‍යතුමා
Hon. Jagath Angage - Minister

ඒක තමයි ප්‍රශ්නය තිබෙන්නේ. දැන් ඒ අය ටිකට් එකකුත් අරගෙන, වාහනය Park කරන්න තැනකුත් දීලා ඒගොල්ලෝ කියනවා, මේ වාහනයට මොන Damage එක වුණත් අපි වගකීම භාර ගන්නෙත් නැහැයි කියලා. ඒ කියන්නේ, කිසිම වගකීමකින්

[ ගරු ජගත් අංගගේ - අමාත්‍යතුමා ]

තොර ක්‍රියාවකට මුදල් අය කිරීමක්. ඒ නිසා විශේෂයෙන්ම මම විශ්වාස කරනවා, ගරු ප්‍රධාන අමාත්‍යතුමා මගින් පළාත් පාලන ආයතනවලට යම් චක්‍රලේඛයක් හෝ යම් විධිවිධානයක් නිකුත් කළ යුතු කාරණාවක් කියලා. මොකද, එහි යම්කිසි පාලනයක් අනිවාර්යයෙන්ම තිබිය යුතු කාරණාවක් වන නිසා. නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට මේ යෝජනාව සභාවට ඉදිරිපත් කිරීම සම්බන්ධව අපේ ගෞරවනීය ස්තුතිය පුද කරමින්, මේ සඳහා විධිවිධාන ක්‍රියාත්මක කිරීම සඳහා ගරු ප්‍රධාන අමාත්‍යතුමාට යොමු කරන ලෙස මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියට ප්‍රකාශ කරමින්, මට කාලය ලබා දීම ගැන ස්තුතිවන්ත වෙමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

[ අ.භා. 12.58 ]

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා මේ අවස්ථාවේදී ගෙනැල්ලා තිබෙන යෝජනාව ඇත්ත වශයෙන්ම අපට ක්‍රියාත්මක කළ හැකි, සත්‍ය වශයෙන්ම ක්‍රියාත්මක කළ යුතු යෝජනාවක් විධියට අපි කල්පනා කරනවා. අද අපි දන්නවා. පළාත් පාලන ආයතනවලට මේ සියලු බලතල නාගරික සංවර්ධන අධිකාරියෙන් පවරලා තිබුණත්, පළාත් පාලන ආයතනවලට බලය ලබා දී තිබෙන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ අණපනත්වලින්. ඒ නිසාම ඒ අනුව කටයුතු කරනවාද නැද්ද කියලා බලන්න නාගරික සංවර්ධන අධිකාරියේ සැලසුම් නිලධාරියෙක් අදාළ පළාත් පාලන අයාතනය තුළ පැවැත්වෙන හැම සැලසුම් කමිටුවකම ඉඳගන්නවා. ඒ නිසා මේ වර්තමානයේ පළාත් පාලන ආයතනවල තිබෙන නීතිරීති, නාගරික සංවර්ධන අධිකාරියේ තිබෙන නීතිරීති අදට ගැලපෙන විධියට වෙනස් විය යුතුයි කියලා අපි කල්පනා කරනවා. දැන් උදාහරණයක් විධියට විශේෂයෙන්ම අපි දන්නවා. 1986.05.10 වැනිදා ගැසට් පත්‍රය තිබෙනවා. මේ ගැසට් පත්‍රයේ පළ වෙලා තිබෙනවා යම් ඉඩමක් වෙන්දේසි කරද්දී ඒ ඉඩමට අනුකූලව කටයුතු කරන ආකාරය පිළිබඳව. එහෙම නැත්නම් යම් ගොඩනැගිල්ලක් වාණිජ වශයෙන් බලපවත්වාගෙන යන්නට නම් ඒ ගොඩනැගිල්ලේ තිබිය යුතු පහසුකම් මොනවාද කියන එක මේ ගැසට් පත්‍රයේ සඳහන් වෙලා, ලියැවිලා තිබෙනවා. ඒ නිසා අපි මතක් කරන්න කැමැතියි. අද එක පැත්තකින් පළාත් පාලන ආයතනවලට නාගරික සංවර්ධන අධිකාරිය දාන නීති රීති නිසාම පළාත් පාලන ආයතනවල ඉන්න සභාපතිවරු නගරාධිපතිවරු එක පැත්තකින් බැණුම් අහනවා. අනෙක් පැත්තෙන් සමහර තැන්වලදී නාගරික සංවර්ධන අධිකාරියත් පොකට් ගහන තත්ත්වයට අද පත් වෙලා තිබෙනවා. දැන් උදාහරණයක් විධියට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මෑත කාලයේ නීතියක් දාලා තිබෙනවා, ඉඩම් අක්කර හෙක්ටයාර් එකකට වැඩි නම් ඒක නාගරික සංවර්ධන අධිකාරියේ අනුමැතියට යවනවා විතරක් නොවෙයි. ඒකට යම් Town Planner කෙනෙකුගෙන්, නගර සැලසුම් ශිල්පියෙකුගෙන් අනුමැතිය ගන්නට ඕනෑය කියලා. දැන් සැලසුම් ශිල්පියා පළාත් පාලන ආයතනයට යනවා. ගිහිල්ලා මේ දරුවන් අතරේ හරි බෙදෙන හෙක්ටයාර එකට වැඩිය ඉඩමක් තිබෙනවා නම්, මේගොල්ලෝ කියනවා Town Planner කෙනෙකුගෙන් අනුමැතිය ගන්න ඕනෑය කියලා. දැන් ලංකාවේ Town Planners ලා වැඩියෙන්ම ඉන්නේ නාගරික සංවර්ධන අධිකාරියේ. හිටපු කිහිප දෙනෙක් විශ්‍රාම ගිහිල්ලා ඉන්නවා නම්, ඒගොල්ලෝ කොහේ හරි නගරයක දැන් කාර්යාලය යොදා ගෙන තිබෙනවා. මේවා මුදලක් හම්බ කරන්න පුළුවන් ව්‍යාපෘති විධියට දැන් ක්‍රියාත්මක වෙන්නේ. දැන් මේ තත්ත්වය අපි අත්විඳලා තිබෙනවා. අපි දැකලා තිබෙනවා. මමත් පළාත් පාලන ආයතනයක ප්‍රධානියෙක් හැටියට ඉන්දැද්දී අපි මේ වාගේ අත්දැකීම් දැකලා තිබෙනවා. දැන් සැලසුම් ශිල්පියා තීන්දුවක් ගන්නවා මේක Town Planner කෙනෙකුගෙන් අත්සන් කර ගන්නට ඕනෑය කියලා. ඒ මනුස්සයා මේ ලිපිගොනුව අරගෙන අර සැලසුම් ශිල්පියාගෙන් අහනවා, කොහෙද Town Planner කෙනෙක් ඉන්නේ කියලා. ඒ පාර මේ සැලසුම් ශිල්පියා කියනවා, එන්න නාගරික සංවර්ධන අධිකාරියට. මම එක්කෙනෙක් හොයලා දෙන්නම් කියලා. ගියාම ලාච්චුවේ තියෙන සීල් එක අරගෙන අර Plan එකේ තියනවා විතරයි. රුපියල් දහ පහළොස්දහක් අර මනුස්සයා ගෙවන්න ඕනෑ. වාණිජමය

වශයෙන් මේ වැඩ කටයුත්ත කරනවාට නොවෙයි, මූලාසසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. ඇත්තෙන්ම තමන්ගේ දරුවන්ට හෙක්ටයාර් එකකට වැඩි ඉඩමක් බෙදන්න ගියාමත් මේ තත්ත්වයටම මුහුණ දීලා තියෙනවා.

දැන් ඕකම වුණා, පහුගිය කාලයේ. යම් ගොඩනැගිල්ලක් වර්ග අඩි පන්දහසකට වැඩි නම් මේ වර්ග අඩි පන්දාහට වැඩිවන සෑම අඩියකටම රුපියල් සියයට එකක මුදලක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවිය යුතුයි කියලා නීතියක් තිබුණා. අපි ඇත්තෙන්ම මේකට විරුද්ධ වුණා. මොකක්ද කළේ? එතකොට නාගරික සංවර්ධන ඇමතිවරයා හැටියට හිටියේ දිනේෂ් ගුණවර්ධන මැතිතුමා. එතුමාගේ ව්‍යාපෘතියක් තිබුණා කුසුම් නිවාස යෝජනා ක්‍රමය කියලා. මේ කුසුම් නිවාස යෝජනා ක්‍රමයට සල්ලි හොයන්න. වර්ග අඩි පන්දාහකට වැඩි නම් 1% ක් නාගරික සංවර්ධන අධිකාරියට ගෙවන්න ඕනෑ. නාගරික සංවර්ධන අධිකාරියට මාසෙකට කෝටි ගණනක් මේ පළාත් පාලන ආයතනයෙන් හොයලා දුන්නාම ගම්වලට ගිහිල්ලා තමන්ගේ පුද්ගලයන්ට තමන් කැමති විධියට නිවාස ආධාර බෙදන්න පටන් ගත්තා. දැන් එතුමා ඇමතිකමේ නැති නිසා ඒ නීතිය වෙනස් වෙලා තියෙන්නේ. විශේෂයෙන්ම මේ තත්ත්වය අද එන්න එන්නම වැඩි වෙනවා. මිනිස්සුන්ගේ තියෙන පීඩාවන් තවදුරටත් වැඩි වෙනවා. මිනිස්සු තමන්ගේ නිවාස සැලසුමක් අනුමත කර ගන්න ගියාම විශාල වශයෙන් තෙරපීමකට ලක් වෙලා තියෙන්නේ මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. විශේෂයෙන්ම මේවාගේ අවස්ථාවකදී අපි මතක් කරන්නේ, අදාළ පළාත් පාලන ආයතනවල එක පැත්තකින් ගොඩකිරීම් පිළිබඳව තමන්ට කැමති විධියට ඒ අවශ්‍ය පුද්ගලයින්ට අනුමැතිය දෙනවා. අකමැති නම් නිකම් ඉන්නවා. ඔබතුමිය ප්‍රකාශ කළා වාගේම, මේ හැම ආයතනයක්ම එකට එකතු වෙලා විශේෂයෙන්ම මේ තත්ත්වය පිළිබඳව පුළුල් විමර්ශනයකට ලක් කරලා මිනිස්සුන්ට තියෙන අසීරුකම්වලින් අමාරුකම්වලින් ඉවත් කරලා යහපත් වූ නීති රීති ගෙනැල්ලා මේ සියල්ල පාලනය කළ යුතු තත්ත්වයකට ගෙන නොගියොත් මම හිතන්නේ, ගොඩකිරීම් නිසා රටට ඇති වෙලා තියෙන තත්ත්වය - අද කොළඹ නගරයේ කොපමණ වැව් හැදුවත්, මම හිතන්නේ හරියට දවස් දෙකක් වැස්සොත් යට වෙනවා. ඒ නිසා මිනිස්සුන්ගේ ජනජීවිත කඩාකප්පල් වෙනවා. කොළඹ නගරයට මේ බලපෑම අද ඇවිල්ලා තියෙනවා. ඒ නිසා අපි විශේෂයෙන්ම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ගෙනාපු මේ යෝජනාව තුළ වඩා වැදගත් වන්නේ - තමන් විසින් ආයතන සැලැස්මක් අදාළ නගර සභාවට ප්‍රාදේශිය සභාවට ඉදිරිපත් කළාම අපි කියනවා වාහන Parking මෙහි තිබිය යුතුයි. අදාළ Toilets නම් මෙපමණ තිබිය යුතුයි. නමුත් මේ සියල්ල තියෙද්දී මම දන්න විධියට මෙහි වාහන පහසුකම් සැලසිය යුතුයි කියලා තියෙනවා ඇරෙන්න මුදල් ගන්න බැහැයි කියන නීතියක් මේකේ නැහැ. නමුත් අදාළ පුද්ගලයාට තමන්ගේ කර්තව්‍යයක් සඳහා ඒ රෝහලට හෝ සුපර් මාර්කට් එකට එනවා නම් මේ වාහනය ලබලා දීලා තියෙන පහසුකම භුක්ති විඳීමට අයිතිය තියෙන්න ඕනෑ. අද ඒ අයිතිය පැහැර ගෙන තියෙනවා. ඒකත් ආදායම් මාර්ගයක් බවට පරිවර්ථනය කර ගෙන තියෙනවා. අනෙක් පැත්තෙන් එහෙම ගත්තත් කමක් නැහැ. බෝඩ් එක ගහලා තියෙනවා, වාහනය සම්බන්ධයෙන් අපේ කිසිදු වගකීමක් ඇත්තෙත් නැහැයි කියලා. ඒ නිසා මිනිස්සුන්ට වගකීමක් නැත්නම් මිනිස්සු පාරේ නවත්තලා යනවා තමන්ගේ වාහනය. නමුත් මෙතැන්ට යන්නේ ගාණක් ගන්න නිසා, මුදලක් ගන්න නිසා ඒ පිළිබඳව ආරක්ෂාවක් ඇතිව. ඒ නිසා මම දකින්නේ, විශේෂයෙන්ම පළාත් පාලන ආයතන තුළ ක්‍රියාත්මක වන නාගරික සංවර්ධන නීති රීති අනුව - අද මේ නීති සම්පූර්ණයෙන්ම වෙනස් වෙලා අලුතෙන් සකස් වෙන්නට ඕනෑ. බලහත්කාරයෙන් කරන දේවල්. ඒක වෙනම දෙයක්. නමුත් මිනිස්සුන්ගෙන් විවිධ වැඩ කටයුතුවලදී අය කරන මේ අධික බදු මම හිතන්නේ මේ සියල්ලටම බලපාලා තියෙනවා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, ඒකයි මම කිව්වේ. මේ නීති රීති අලුතින් සකස් වෙලා, මේ යල් පැන ගිය ඒවායේ තත්ත්වය පිළිබඳව විමර්ශනයට ලක් කරලා අලුත් නීති රීති සකස් කළ යුතුයි. අනෙක් එක තමයි අද විශාල වශයෙන් ඉඩම් වෙන්දේසි කරනවා. ඒ ඉඩම් වෙන්දේසි කළාට ඒ වෙන්දේසි ඉඩම්වල ජල බස්නා කාණු පද්ධතිය සකස් වන්නේ නැහැ. පොදු පහසුකම් ඉඩම් ටික තමන්ට අවශ්‍ය පරිදි - සමහර පළාත් පාලන ආයතන සභාපතිවරු තමන්ට ඕනෑ නම් කෙළවරකින් දීලා ගණනකුත් අත යට දාගන්න මට්ටමට ගිහිල්ලා තියෙනවා.

**ගරු මන්ත්‍රීවරයෙක්**
An hon. Member

ඒ කොහේ සභාවේද?

**ගරු මංජු ශ්‍රී අරංගල** - විපක්‍ෂ නායකතුමා
Hon. Manju Sri Arangala - Leader of the Opposition

බොහෝ සභාවල. මම හිතන්නේ, එතුමා මොකක් හරි දන්නවා. ඒකයි ඇහුවේ කොහේද කියලා. ඒ නිසා සමහර තැන්වල වෙන්දේසිකරුවෝ තමන්ට වුවමනා විධියට තමන්ගේ කටයුත්ත කරනවා. සභාපතිවරු නිහඬව ඉන්න තත්ත්වයකට පත් වෙලා තියෙන්නේ, මුදල්මය තත්ත්වයෙන් යට කර තිබෙන නිසයි. ඒ නිසා තමයි අද මිනිස්සුන්ට විශාල වශයෙන් කරදර තත්ත්වයන් ඇති වෙලා තියෙන්නේ. ඒ නිසා විශේෂයෙන්ම නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමා ගෙනැල්ලා තියෙන මේ යෝජනාව තුළ අපට කියන්න තියෙන්නේ, පළාත් සභාවට කළ හැකි, ඒ වාගේම කළ යුතු ඉතාම වැදගත් වූ යෝජනාවක් කියලයි. මේ යෝජනාවේ දැක්වෙන පරිදි මේ කටයුත්ත ඉතාම ඉක්මණින් කළොත් තමයි මේ පළාත් පාලන ආයතනවලටත්, අනෙක් පැත්තෙන් නාගරික සංවර්ධන අධිකාරියටත් - නාගරික සංවර්ධන අධිකාරියේත් එක පැත්තකින් හම්බු කරන බොහෝ නිලධාරීන් ඉන්නවා. අපි ඒක දකිනවා. සමහර පළාත් පාලන ආයතනවලට එන සැලසුම් නිලධාරීන් සැලසුම් කමිටුවේදී File එක අරගෙන, අපට ආරංචියි නැවත මේ ප්‍රධාන කාර්යාලයට එනවා කියලා. එසේ ඇවිල්ලා සැලසුම් කමිටුවේ තිබෙන ටෙලිෆෝන් නොම්මරයට අදාළ පුද්ගලයාට කථා කරනවාලු. කථා කරලා කියනවාලු ඔයාගේ

ප්ලෑන් එක සම්බන්ධයෙන් පොඩ්ඩක් මාව ඇවිල්ලා හම්බ වෙන්නය කියලා. මේ තත්ත්වයක් තිබෙන්නේ. මේ විධියට හැම තැනම ජරාව කන තත්ත්වයට පත් වෙලා. හැම තැනම කිව්වොත් වැරදියි. යහපත් තැන් තිබෙනවා. ඒක අඩු නිසා වැඩියෙන්ම පේන්නේ අර තත්ත්වයට ලක් වුණු තැන්. මේ නීතිරීති වෙනස් විය යුතුයි කියන දේ නැවත වරක් මතක් කරමින්, මේ යෝජනාව ගෙනාපු නිරෝෂන් පාදුක්ක ගරු මන්ත්‍රීතුමාට අපේ ස්තුතිය පළ කරමින් මගේ අදහස් මම මෙයින් සමාප්ත කරනවා. ස්තුතියි.

[ අ.භා. 01.07 ]

**ගරු නිරෝෂන් පාදුක්ක**
Hon. Niroshan Padukka

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, විශේෂයෙන්ම මේ යෝජනාවට අදහස් දැක්වූ අශෝකා ලංකාතිලක මැතිනියටත්, මුජිබුර් රහුමාන් ගරු මන්ත්‍රීතුමාටත්, ගුණසිරි ජයනාත් ගරු මන්ත්‍රීතුමාටත්, සෞඛ්‍ය ගරු අමාත්‍යතුමාට සහ මංජු ශ්‍රී අරංගල ගරු විපක්ෂ නායකතුමාට මගේ පෞද්ගලික ස්තුතියත්, ඒ වාගේම දහසක් වැඩ මැද්දේ මෙහි රැඳී සිටි උදය ගම්මන්පිල ගරු අමාත්‍යතුමාටත්, අපේ උපාලි කොඩිකාර ගරු අමාත්‍යතුමාටත්, ඒ වාගේම දහවල් දානය කැප කරමින් අපත් එක්ක හිටිය අපේ හාමුදුරුවන්ටත්, මේ සියලු දෙනාටම මගේ ගෞරවනීය ස්තුතිය පිරිනමනවා.

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අපි මේ සභාවට බොහෝ යෝජනා ගෙනැල්ලා තිබෙනවා, ඔබාමාට පාට් එක දාන්න. ජයලලිතාට. කරුණානිධිට. ඉන්දියාවට. අපේ පළාත් සභාවේ ඒ යෝජනා එන කොට මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි,
[ ගරු නිරෝෂන් පාදුක්ක ]

මේ මන්ත්‍රීවරු අසූවක්, අනූවක් මේ සභාවේ ඉන්නවා. අවසානයේ අත උස්සා ගන්න. හැබැයි, මම මේ ගෙනාපු යෝජනාව බස්නාහිර පළාත සුදු අලියෙක් කියන එකවත් අඩු ගණනේ පේන්නේ නැති වෙන්න, බස්නාහිර පළාතේ ඉන්න ජනතාවට බස්නාහිර පළාත් සභාව තීන්දුවක් අරගෙන ක්‍රියාත්මක කරන්න, තමන් යටතේ තිබෙන පළාත් පාලන ආයතනවලට පණිවිඩයක් යවන්න පුළුවන් යෝජනාවක්. ඒ යෝජනාවේදීත් හිටියේ අපේ මන්ත්‍රීවරු කී දෙනාද? මම එළියේ හිටිය මන්ත්‍රීවරු ටිකත් එක්කම ගණන් කළත් තවම මේක ඇතුළේ ඉතාම සුළු පිරිසක් ඉන්නේ. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි. මේක තමයි සභාවේ යථාර්ථය. අපිම කථා කරනවා පළාත් සභාව සුදු අලියෙක් කියලා. හැබැයි, මේකේ කරන්න පුළුවන් දාහක් දේ තිබෙනවා. ඒක ඇතුළේ කරන්න. හැබැයි, මේ යෝජනාව සම්බන්ධයෙන් මෙහි රැඳී සිටිමින් මේ යෝජනාවට අනුගත වූ සියලුම මන්ත්‍රීවරුන්ටත් - ගරු ඔබතුමිය හරහා මම හැකි ඉක්මණින් ඉල්ලනවා. පළාත් පාලන කොමසාරිස්තුමියට මේ පිළිබඳව ඉදිරිපත් කරලා සභා සම්මත වූ යෝජනාව - සම්මත වුණොත්. හැකි ඉක්මණින් මෙය ක්‍රියාත්මක තලයට පමුණුවන්න කියලා. මොකද, මේකෙන් දුක් විඳින්නේ මේ රටේ අහිංසක, බස්නාහිර පළාතේ බදු ගෙවන ජනතාව. ඒ විතරක් නොවෙයි ලංකාව පුරාම. බස්නාහිර පළාතේ කිව්වාට අර ජයනාත් මන්ත්‍රීතුමා කිව්වා වාගේ මේක කළුතරත් තිබෙනවා. මේක ගම්පහත් තිබෙනවා. හැම තැනම තිබෙනවා. ඒ නිසා මේ සම්බන්ධයෙන් ඔබතුමිය ක්‍රියාත්මක කරන්න අවශ්‍ය කටයුතු සම්පාදනය කර දෙන මෙන් ඉල්ලා සිටින අතර, මම කනගාටු වෙනවා අපේ ප්‍රධාන අමාත්‍යතුමා දිවයිනෙන් බැහැරව සිටීමට සිදුවීම නිසා.

මම විශ්වාස කරනවා එතුමාට අදාළ කරුණු කාරණා ඒ අදාළ අමාත්‍යවරයා පැහැදිලි කරලා දීලා, මේ සම්බන්ධයෙන් අවශ්‍ය තීන්දු තීරණ ලබා දෙන්න අවශ්‍ය සහාය ලබා දෙයි කියලා.

ඒ වාගේම මේ යෝජනාවට කථා කරද්දී සමහර ගරු මන්ත්‍රීවරු අපහාස, උපහාස මටත් කරන්න උත්සාහ කළා. මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, අටලෝ දහමින් අපි සැලෙන්නේ නැහැ. මම එම්.එස්. ප්‍රනාන්දුගේ බයිලත් අහලා තිබෙනවා. මෑත කාලයේ කියන අලුත් ගායකයින්ගේ බයිලාත් අහලා තිබෙනවා. ඒ නිසා ඒ සියලුම බයිලා අහගෙන ඉන්න අපට කශේරුවකුත් තිබෙනවාය කියලා ප්‍රකාශ කරමින් මම නිහඬ වෙනවා. බොහොම ස්තුතියි.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

## කල් තැබීමේ යෝජනාව
## ADJOURNMENT

**ගරු උදය ප්‍රභාත් ගම්මන්පිල -** අමාත්‍යතුමා
Hon. Udaya Prabhath Gammanpila - Minister

මූලාසනාරූඪ ගරු මන්ත්‍රීතුමියනි, "*දැන් මෙම සභාව කල් තැබිය යුතුයි*" කියලා යෝජනා කරනවා.

***ප්‍රශ්නය විමසන ලදින්, සභා සම්මත විය.***
*Question put and agreed to.*

***ඊට අනුකූලව පළාත් සභාව අ.භා. 01.10 ට, 2013 ජූනි මස 04 වන දින පූ.භා. 9.30 වන තෙක් කල් ගියේය.***
*Sitting, accordingly adjourned at 01.10 p.m till 9.30 a.m. on 04.06.2013.*